2017


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA




# පෙර දැක්ම

## 2017 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

# 2017 සහ ඉදිරිය සඳහා
# මුදල් සහ මූල්‍ය අංශ
# ප්‍රතිපත්ති පෙර දැක්ම


**ඉදිරිපත් කිරීම**

**ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි**

**අධිපති**

**ශ්‍රී ලංකා මහ බැංකුව**


***2017 ජනවාරි 3***

# 1. හැඳින්වීම

ගරු සම්භාවනීය අමුත්තනි, මුදල් මණ්ඩල සාමාජිකයිනි, නියෝජ්‍ය අධිපතිවරුන් ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරී මහත්ම මහත්මියනි, විශේෂ ආරාධිත අමුත්තනි, නෝනාවරුනි, මහත්වරුනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2007 වසරේ දී ආරම්භ කරන ලද **ප්‍රතිපත්ති පෙර දැක්ම** ඉදිරිපත් කිරීම මහ බැංකුවේ ඉතා වැදගත් සම්ප්‍රදායක් වන අතර, අද දින අප විසින් ඉදිරිපත් කරනු ලබන්නේ එහි 10 වන ප්‍රකාශයයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන **ප්‍රතිපත්ති දිශානතිය** ඔබ සැම සමඟ බෙදා ගැනීම තුළින් අපගේ මැදි කාලීන ආර්ථික ප්‍රතිපත්ති **කල් ඇතිව දැන ගැනීමටත්,** එම ප්‍රතිපත්තිවල **විනිවිදභාවය** වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීමටත් හැකි වන අතර, එය ඔබගේ ව්‍යාපාර සැලසුම් සහ මෙහෙයුම් කටයුතු වඩාත් සාධනීය ලෙස සැලසුම් කිරීමටත් උපකාරී වනු ඇති බව අපගේ විශ්වාසයයි. එසේම, එතුළින් අපගේ ප්‍රතිපත්ති සහ අප විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව **මනා පැහැදිලිභාවයක්** ද සහතික කෙරෙනු ඇත.

මෙම වාතාවරණය හමුවේ, **පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ අරමුණුවල අනුකූලතාවයක් සහ වඩා ඉහළ සම්බන්ධීකරණයක් පැවතීම** අපගේ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා විවර කරනු ඇති අතර, එමගින් අපගේ පොදු සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමට අනුබලයක් ලැබෙනු ඇත.

එමනිසා, මෙම වසරේ ප්‍රතිපත්ති පෙරදැක්ම ඉදිරිපත් කිරීමේ මෙම කටයුත්ත සඳහා සපැමිණි ඔබ සියලු දෙනා උණුසුම් ලෙස මම පිළිගනිමි.

නෝනාවරුනි, මහත්වරුනි, ඔබ දන්නා පරිදි ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය කිරීම දිරිමත් කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අදහස පෙරදැරිව **ආර්ථික සහ මිල ස්ථායීතාව අත්කර ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු වේ.** අප වෙත ලබා දී ඇති බලතල අනුව, සාමූහිකව මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා අපි ඉහළම ප්‍රමුඛතාව ලබා දෙන්නෙමු. ශ්‍රී ලංකා මහ බැංකුව සතු සැලකිය යුතු සම්පත් ප්‍රමාණය තිරසාර පදනමක් මත මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහාත්, අප වෙත පැවරී ඇති වැදගත් නියෝජිත සහ අනුයාත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහාත් ඵලදායී ලෙස යොදවනු ලැබේ.

2016 වසර තුළ දී ආර්ථික සහ මිල ස්ථායීතාව අත්කර ගැනීම සඳහා අප විසින් වඩාත් විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රැසක්

ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ආර්ථිකයේ **ඉල්ලුම් පීඩනය සීමා කිරීම සහ උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගැනීම** සඳහා මෙම ප්‍රතිපත්ති උපකාරී වී ඇත. එසේම, අදාළ **ආයතන ශක්තිමත් කිරීම**, වෙළඳපොළවල කාර්යක්ෂම හා ක්‍රියාකාරී බව තහවුරු කිරීම මෙන්ම සුරක්ෂිත හා සුදුසු **ගෙවීම් යාන්ත්‍රණයන්** පැවතීම සහතික කිරීම අරමුණු කර ගනිමින් අපි **මූල්‍ය අංශය** ආශ්‍රිත ප්‍රතිපත්ති රැසක් ද හඳුන්වා දුන්නෙමු.

මා විසින් මොහොතකට පෙර සඳහන් කළ අපගේ මූලික අරමුණු හා සම්බන්ධ ප්‍රධාන කාර්යයන්ට අමතරව, අප විසින් ආර්ථිකයේ සමස්ත ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට දායක වෙමින් **නියෝජිත හා අනුයාත කාර්යයන්** රාශියක් ඉටු කරනු ලැබ ඇත.

රජයේ මූල්‍ය අවශ්‍යතා සහ එහි ගෙවීම් වගකීම් විචක්ෂණශීලී අවදානම් මට්ටමක් හා අනුරූපව මැදි සහ දිගු කාලීනව අවම පිරිවැයකින් සපුරා ගැනීම සහතික කිරීම සඳහා මහ බැංකුව **රාජ්‍ය ණය** කළමනාකරණය සිදු කරනු ලබයි. දේශීය සහ විදේශීය ආයෝජකයින් හට වඩා සුදුසු වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා **විනිමය පාලන** දෙපාර්තමේන්තුව ද බොහෝ ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. මේ හා සම්බන්ධ කටයුතු තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා නව විදේශ විනිමය පනතක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත. විදේශ විනිමය ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීම සඳහා මැදි කාලීනව බොහෝ ක්‍රියාමාර්ග ගනු ඇත. රටෙහි විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල වන **සේවක අර්ථසාධක අරමුදලේ** කළමනාකරු වන්නේ ද මහ බැංකුවයි. **ප්‍රාදේශීය සංවර්ධන** දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල හරහා මහ බැංකුව විසින් රටේ කෘෂිකාර්මික අංශය සහ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත අරමුදල් ගලා යාම ශක්තිමත් කිරීමට ද, එමගින් ඉහළ මූල්‍ය අන්තර්ගතභාවයක් සඳහා පහසුකම් සැලසීමට ද අපේක්ෂා කරයි. එමෙන්ම, **මුදල් නිකුත් කිරීමේ පරම අධිකාරිය** ලෙස මහ බැංකුව සියලු මුදල් ගනුදෙනු සුමට ලෙස සිදු වන බව අඛණ්ඩව සහතික කර ඇත.

ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කරගෙන යාමේ දී හා අපගේ වගකීම් ඉටු කිරීමේ දී අපි සන්නිවේදනය අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකමු. **පැහැදිලි සන්නිවේදනයෙහි** සහ **වැඩිදියුණු වූ විනිවිදභාවයෙහි** වැදගත්කම උපරිම ලෙස සැලකිල්ලට ගනිමින් අපි **ඉදිරි දැක්මක් සහිතව** අපගේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන්නෙමු. මෙය, ආර්ථිකයේ කොටස්කරුවන්හට වඩා දැනුම්වත් ලෙස සිය ආර්ථික තීරණ ගැනීමෙහිලා උපකාරී වනු ඇත.

නෝනාවරුනි, මහත්වරුනි, අද අපි ජීවත් වන්නේ **අභියෝගවලින් පිරි ලෝකයකයි.** ශ්‍රී ලංකාව ක්‍රමයෙන් ඉහළ මැදි ආදායම් ආර්ථිකයක් සහිත රටක් බවට පරිවර්තනය වෙමින් සිටී. කෙසේ වෙතත්, රාජ්‍ය සහ පෞද්ගලික අංශවල **කටයුතු පෙර පරිදි**

**සාමාන්‍ය ලෙස** පවත්වා ගැනීමෙන් රජයේ අරමුණු මෙන්ම ජනතාවගේ අපේක්ෂාවන් ද ඉටු කර ගත නොහැකිය. රජයේ ප්‍රතිපත්ති සම්පාදන කටයුතු, පවතින තත්ත්වයන් හඳුනා ගෙන **පූර්ව ක්‍රියාමාර්ග ගන්නා ආකාරයෙන්** සිදු කළ යුතුය. එය ප්‍රධාන වශයෙන් **ආර්ථික දත්ත මත** සිදු විය යුතු අතර, **කෙටිකාලීන දේශපාලන අරමුණුවල බලපෑම අවම විය යුතු ය.** ඒ හා සමානවම, පෞද්ගලික අංශය **සිය අවදානම් පිළිබඳ ආකල්පය හැඩගස්වා ගත යුතු අතර** වැඩිදියුණු වන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ව්‍යාපාර සඳහා වඩා සුදුසු ලෙස නිර්මාණය වන පරිසරයක් තුළින් ඇති කෙරෙන අවස්ථාවලින් ප්‍රයෝජන ගත යුතුව ඇත. අප  ගමන් කළ යුතු මාර්ගය පැහැදිලි සහ සාධනීය වන අතර, අපි තවත් වේගයෙන් අභිවෘද්ධිය ළඟා කර ගැනීමට කැමැත්තෙමු. ඉහළ වර්ධන ප්‍රවණතාවත්, රැකියා බිහි කිරීමත්, ආදායම් ඉහළ නැංවීමත් සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාවට නැංවීම සඳහා කැපවීමක් පවතින්නේ නම් ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමේ දී ආර්ථිකයේ අපේක්ෂිත වෙනස්කම් වඩා වැඩි වේගයකින් සිදු වීමේ හැකියාවක් ද පවතී.

**මෙම  අත්‍යවශ්‍ය වූ පරිවර්තනයෙහි ප්‍රමුඛ ආයතනයක් ලෙස** ශ්‍රී ලංකා මහ බැංකුව වන අපට **ඉතා වැදගත් කාර්යභාරයක්** ඉටු කළ යුතුව තිබේ. රට දියුණු කිරීම සඳහා නව ක්‍රියාමාර්ග රාශියක් රජය විසින් ඉදිරිපත් කර ඇත. මෙය සිදු වන්නේ ගෝලීය ආර්ථිකය තවත් එක් සංක්‍රාන්තික කාලපරිච්ඡේදයක පවතින අවස්ථාවකයි. එනිසා, මෙය ඇත්ත වශයෙන්ම **අභියෝගාත්මක කාලයක්** වන අතර, එම තත්ත්වය අපට විචක්ෂණශීලී වීමට මෙන්ම ප්‍රතිඵල කෙරෙහි අවධානයෙන් කටයුතු කිරීමට බල කර සිටියි.

මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ වඩා **පුළුල් දැක්මකින්** යුතුව මගේ අදහස් කිහිපයක් ඔබ වෙත ඉදිරිපත් කිරීමට මා කැමතියි.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය විමසීමට ලක් කිරීමේ දී අපට මෙයට වඩා වැඩි යමක් කළ හැකිව තිබූ බව පැහැදිලිය. මහ බැංකුව වශයෙන් ගත් විට, වසර ගණනාවක් මුළුල්ලේ පැවති විශාල රාජ්‍ය මූල්‍ය හිඟයන් තුළින් ඇති කරන ලද ආර්ථිකයේ **සමස්ත ඉල්ලුම් අතිරික්තය විසින් මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති සංකීර්ණ කරනු ලැබ තිබේ.**

කෙසේ වෙතත්, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා **නිදහසින් පසු ලැබුණු හොඳම අවස්ථාවන්ගෙන් එකකට** ශ්‍රී ලංකාව මුහුණ දී සිටින බව මගේ විශ්වාසයයි. විශේෂයෙන්ම, අභ්‍යන්තර අර්බුද හෝ ප්‍රතිපත්ති තුළින් ආපස්සට ඇදෙන තත්ත්වයක් වර්තමානයේ රට තුළ නොමැත.

අද වන විට, ශ්‍රී ලංකාව **සංවර්ධනයේ නවමු පියවරක්** සඳහා සූදානම්ව සිටියි. එම වාතාවරණය හමුවේ, ශක්තිමත් සහ තිරසාර සංවර්ධනයක් සහ සේවා නියුක්තියක් ඇති

කිරීමට අවශ්‍ය ආයෝජන ලබා ගැනීම සඳහා රටෙහි අනර්ඝ වූ **භූගෝලීය පිහිටීම** සහ **වාසිදායක ජාත්‍යන්තර සබඳතා** ප්‍රයෝජනයට ගැනීම සඳහා සුදුසු වඩා ස්ථාවර පදනමක් සැකසීම මහ බැංකුවේ වගකීම වේ. ශ්‍රී ලංකාව, වේගයෙන් වර්ධනය වන විශාල ආර්ථිකයක් වන ඉන්දියාවේ සිට සැතපුම් 20 ක දුරින්, චීනයේ මුහුදු සේද මාවත මධ්‍යයේ පිහිටා ඇති අතර, ලෝකයේ ප්‍රාග්ධන අතිරික්තයන් සහිත රටවල් රාශියක් සමඟ සාර්ථක සබඳතා පවත්වා ගැනීමට තරම් වාසනාවන්ත වී ඇත.

මා නැවත නැවතත් අවධාරණය කර ඇති පරිදි, තිරසාර වර්ධනයක් සඳහා **සාර්ව ආර්ථික මූලධර්ම ශක්තිමත් කිරීම,** රටේ තරගකාරිත්වය ඉහළ නැංවෙන ආකාරයේ **ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ** සිදු කිරීම සහ **ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම** අවශ්‍ය වේ.

මේ මොහොතේ අප හමුවේ ඇති අභියෝගය වන්නේ අවිනිශ්චිත ගෝලීය ආර්ථික තත්ත්වයන් හමුවේ රටේ සාර්ව ආර්ථික මූලධර්ම **තිරසාර ලෙස ස්ථායීකරණය** කළ හැකි ආකාරයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමයි.

දශක ගණනාවක් මුළුල්ලේ ආර්ථික මූලධර්මවලට අනුකූල නොවන ආකාරයේ අස්ථාවර සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වී ඇති වාතාවරණයක් තුළ, සංයමයකින් තොරව ආර්ථික ස්ථාවරභාවයක් ඇතිකර ගැනීම අපහසු බව හඳුනා ගැනීම වැදගත් ය.

මෙය අවශ්‍යයෙන්ම **කෙටි කාලීනව යම් අසීරුතා** ඇති කරනු ඇත. කෙසේ වෙතත්, දැනටමත් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්ති සහ වැඩසටහන් තුළින් වඩා **අපේක්ෂා සහගත අනාගතයක්** උදා කර ගැනීම සඳහා හැකියාවක් ඇත. එසේ වීමට නම්, ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම, වැඩි දියුණු වන ඵලදායීතාව/තරගකාරිත්වය සහ වැඩිදියුණු වන ව්‍යාපාරික වාතාවරණය යන අංශ තුන හා සම්බන්ධව **ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අවශ්‍යතාව** පිළිබඳව **දේශපාලනඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්** සහ **මහජනතාව** අතර **පොදු එකඟතාවයක්** ගොඩනැංවිය යුතුව ඇත.

අප විසින් **නව ආර්ථික වර්ධන ආකෘතියක්** සඳහා වූ අවශ්‍යතා ළඟා කර ගැනීම සඳහා මූලික ප්‍රතිපත්ති මත, ඉහළ වටිනාකමක් සහිත ව්‍යවසාය තත්ත්වයන් ගොඩනැංවීමට සහ සියලු ශ්‍රී ලාංකිකයන්ට ප්‍රතිලාභ ඇති කරන්නා වූ නිර්මාණශීලී සහ නවෝත්පාදන බිහි කිරීමට හේතු වන ආකාරයේ **ශක්තිමත් පදනමක්** ස්ථාපනය කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා ආර්ථිකයේ මූලික දුර්වලතා වන විශාල රාජ්‍ය මූල්‍ය සහ වෙළඳ හිඟය හේතුවෙන් වසර ගණනාවක් මුළුල්ලේ ප්‍රසාරණය වූ **ව්‍යුහාත්මක ගැටලු** රාශියක් රට තුළ පවතී. අයවැය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය යන **හිඟ දෙකක් (twin deficits) පවතින රටක් වීම** තුළින් අස්ථාවර සහ විචලනය වන ගෝලීය ආර්ථික

වාතාවරණයන් තුළ කම්පනයන්ට ගොදුරු වීමේ හැකියාව ඉහළ යයි.

**තිරසාර නොවන අයවැය හිඟයක් පැවතීම** ආර්ථිකයෙහි **අතිරික්ත මෙන්ම ඔරොත්තු නොදෙන ඉල්ලුමක්** ජනිත කරයි. එලෙස අතිරික්ත ඉල්ලුමක් පැවතීම ආර්ථිකයෙහි **උද්ධමන පීඩනය** ඉහළ නැංවීමට සහ **නාමික පොලී අනුපාතික ඉහළ යෑමට** හේතු වනු ඇත. තවද, දේශීය වශයෙන් සැපයුමෙහි පවත්නා සීමා හේතුවෙන් ආනයන සඳහා වන නැඹුරුව ද ඉහළ යනු ඇත. එසේම, මෙමගින් ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතික මත ද පීඩනයක් ඇති වේ.

මෙය පසුගිය දශක කිහිපය පුරාවට ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් අත්දැකීම වන අතර, එය ආර්ථික වශයෙන් ඉහළ අභිවෘද්ධියක් ලැබූ නැගෙනහිර සහ අග්නිදිග ආසියානු රටවල් අනුගමනය කළ ප්‍රතිපත්ති සමඟ සැසැඳීමේ දී පැහැදිලි වෙනසක් පෙන්නුම් කරයි. මෙම රටවල් ලබාගත් ආර්ථික අභිවෘද්ධිය සඳහා **ශක්තිමත් රාජ්‍ය මූල්‍ය අංශයක්** මෙන්ම **උද්ධමනය සහ පොලී අනුපාතික පහළ මට්ටමක පවත්වා ගැනීම** හා **තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම** වැනි ප්‍රතිපත්ති දායක වී ඇත.

අපට ආර්ථික අභිවෘද්ධිය සඳහා අවශ්‍ය වූ ප්‍රතිපත්ති වරින් වර ක්‍රියාවට නංවමින් නැවත ඉන් අපගමනය වෙමින් සිදු කරනු ලබන මෙම ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාත්මක කළ නොහැකි අතර, එසේ දිගින් දිගටම සිදු වුවහොත්, අනාගතයෙහි මුහුණ දීමට සිදු වන අභියෝගයන් තවත් අනතුරුදායක වනු ඇත. එබැවින්, අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උනන්දුවෙන් ක්‍රියා කළ යුතු ය. අප දැනටමත් බොහොමයක් අවස්ථාවන් මගහැර ගෙන ඇති බැවින් නැවත නැවතත් එසේ අවස්ථාවන් මගහැර ගත නොහැකි ය. එබැවින්, අප **තීරණාත්මක ප්‍රතිපත්ති කැපවීමෙන්** යුතුව ක්‍රියාත්මක කළ යුතු ය. විශේෂයෙන්ම, **දිගුකාලීන දැක්මකින්** යුතුව කටයුතු කිරීම බෙහෙවින් වැදගත් වේ.

ආර්ථික කටයුතු, දේශපාලන කටයුතුවලින් බැහැරව සිදු කිරීමට හැකි යැයි විශ්වාස කිරීම නිවැරදි දැක්මක් ලෙස සැලකිය නොහැකි ය. මෙය කිසිදු රටකට හෝ කිසිදු සමාජයකට සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූවකි. කෙසේ වෙතත්, බොහොමයක් සමාජ-ආර්ථික දර්ශකවලින් ආසියානු කලාපයේ ජපානයට පමණක් දෙවැනි වූ **ශ්‍රී ලංකාව** මේ වන විට **මෙවැනි පසුබෑමකට පත් වූයේ** මන්ද යන්න අප විසින් විමසා බැලිය යුතු කරුණකි.

තවද ආසියාවේ ශතකය ලෙස හැඳින්වෙන මෙම කාල වකවානුවේ දී ආර්ථික නියාමනයන්ට අනුව සැලකීමේ දී දුර්වල තත්ත්වයක් පිළිබිඹු කරනු ලබන දර්ශකයක් වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහනකට යොමු වී සිටින ඇෆ්ගනිස්ථානය හැරුණු විට එකම ආසියා පැසිෆික් කලාපීය ආර්ථිකය බවට ශ්‍රී ලංකාව පත් වූයේ මන්ද යන්න අප විසින්ම විමසිය

යුතුව ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩ සටහනකට සම්බන්ධ වීම රෝගී තත්ත්වයෙන් රෝහල්ගත කිරීමකට සමාන කළ හැකි ය. අප ආර්ථිකය දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කළ යුතු අසාධ්‍ය රෝගියෙකු බවට පත් වී නොමැති නමුත් පැහැදිලිවම රෝහල් ගත කළ රෝගියෙකු බවට පත්ව ඇත. මේ සඳහා **ලබා දිය යුතු ප්‍රතිකාරය අප දන්නා අතර,** එය දැනටමත් ආරම්භ කර තිබීම සතුටුදායක කරුණකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ද මේ වන විටත් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය ඇගයීමට ලක් කොට ඇත. **රාජ්‍ය මූල්‍ය අංශයෙහි වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වය** මෙම ප්‍රගතියෙහි වැදගත්ම අංශය වන බැවින් ඒ සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ කාර්යභාරය අගය කළ යුතු ය. කෙසේ වෙතත්, අප ඉදිරියේ පවත්නා අභියෝගය වනුයේ අපගේ ඉදිරි දැක්ම පිළිබඳව පැහැදිලි අවබෝධයකින්, ඉලක්කයකින් සහ අධිෂ්ඨානයකින් යුතුව අවශ්‍ය වෙනස්කම් ක්‍රියාවට නැංවීමයි. මෙම කාර්යය **ජාතික ප්‍රයත්නයක් තුළින්** සිදු කළ යුතුව තිබේ.

අප ආර්ථිකයට ලබා ගත හැකි ඉහළ දියුණුව පැහැදිලිවම දැකිය හැකි අතර මේ සඳහා රජයේ සැලැස්ම, ක්‍රියා පිළිවෙළ සහ ව්‍යාපෘතීන් ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රකාශයෙන් සහ අයවැය ප්‍රකාශය තුළින් මැනවින් පෙන්වා දෙයි. කෙසේ වුවත්, දැන් අපට ඇති අභියෝගය වනුයේ මෙම යහපත් අරමුණු ක්‍රියාවට නැංවීමයි. මෙම වර්ධන මාවතෙහි ඉදිරියට යාම සඳහා **ආර්ථික තීරණ ගැනීමේ** දී ආර්ථිකයෙහි සහ දේශපාලනයෙහි **ප්‍රතිතුලනයක්** සිදු වීම අවශ්‍ය වනු ඇත.

රජය මේ වන විට **ආදායම මත පදනම් ව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක්** ඇති කිරීමේ ක්‍රියාවලියක නියැළී සිටී.

ශ්‍රී ලංකාවේ දැනට අත්පත් කර ගැනීමට අසමත් වූ නමුත් අත්පත් කර ගත හැකි වෙළඳ හා ආයෝජන ශක්‍යතාවන් ළඟා කර ගැනීම සඳහා **වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති** ද වෙනස් කරමින් සිටී.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අපි ද මේ වන විට අපගේ ක්‍රියාවලි සහ ප්‍රතිපත්ති වෙනස් කරමින් සහ වැඩිදියුණු කරමින් සිටිමු.

මහ බැංකුව, **දත්ත මත පදනම්ව පවතින තත්ත්වයන් හඳුනා ගෙන පූර්ව ක්‍රියාමාර්ග ගනු ලබන මුදල් සහ විනිමය අනුපාතික ප්‍රතිපත්ති රාමු සම්පාදනය කරමින් සිටියි.**

මෙම සන්දර්භය තුළ**, 2017 වසරේ ප්‍රතිපත්ති පෙර දැක්ම** ආර්ථිකයෙහි දැනට සිදු වී ඇති ප්‍රවණතා සහ පසුගිය වසර තුළ ගෙන ඇති ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමාලෝචනය කරයි. විශේෂයෙන්ම, මෙමගින් අනාගතයේ දී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ද ඉදිරිපත් කරනු ලැබේ.

ඒ අනුව, 2017 ප්‍රතිපත්ති පෙර දැක්මෙහි පෙළ ගැස්ම පහත සඳහන් පරිදි වේ.

- ***2 වන කොටස:*** 2016 වසර තුළ දී මූර්ත, රාජ්‍ය මූල්‍ය, විදේශීය, මුදල් සහ මූල්‍ය අංශවල ප්‍රගතිය සමඟ ආර්ථිකයේ සිදු වූ වර්ධනයන් පිළිබඳ විශ්ලේෂණය

- ***3 වන කොටස:*** 2017 වසර සහ ඉන් අනතුරුව මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මූලෝපායන් සහ ප්‍රතිපත්ති පිළිබඳ විග්‍රහයක්

- ***4 වන කොටස:*** 2017 වසර සහ ඉන් අනතුරුව මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ ස්ථාවරත්වය පිළිබඳ මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳව සාකච්ඡාවක්

- 5 ***වන කොටස:*** මහ බැංකුවේ නියෝජිත සහ අනුයාත කාර්යයන් තුළින් ආර්ථිකය වඩා පුළුල් ලෙස ශක්තිමත් කිරීම හා සම්බන්ධ මූලික ප්‍රතිපත්ති

- ***6 වන කොටස:*** සමාප්ති සටහන්

# 2. 2016 වසරේ ආර්ථික ප්‍රවණතා

**ශ්‍රී ලංකා ආර්ථිකය** 2016 වසරේ මුල් මාස නවය තුළ දී සියයට 4 ක **මධ්‍යස්ථ වර්ධනයක්** අත්කර ගත්තේය. සහල්, තේ සහ රබර් ආදියෙහි එකතු කළ අගය අඩු වීම හේතුවෙන් ප්‍රධාන ආර්ථික අංශ අතරින් **කෘෂිකාර්මික** අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය. වසරේ දෙවැනි හා තෙවැනි කාර්තුවල පැවැති අයහපත් කාලගුණය සහ ප්‍රධාන අපනයන ගමනාන්තයන්ගේ පැවැති මන්දගාමී ඉල්ලුම් තත්ත්වයන් මෙම වර්ධනය කෙරෙහි බලපෑවේය. ඉදිකිරීම් ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත්වීමත් සමඟ ඉදිකිරීම් අංශයේ දායකත්වය සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් 2016 වර්ෂයේ දී **කර්මාන්ත** ආශ්‍රිත ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස වර්ධනය විය. නිෂ්පාදන සහ පතල් හා කැණීම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන වර්ධනයක් දැකිය හැකි විය. මේ අතර, මූල්‍ය සේවා සහ තොග හා සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම් වර්ධනය වීම හේතුවෙන් **සේවා** අංශයේ වර්ධනය ද යහපත් මට්ටමක පැවතුණි. මේ දක්වා අත්කර ගත් මෙම වර්ධනයන් පාදක කර ගනිමින්, 2016 වසරේ දී ආර්ථිකය සියයට 4.5 - 5.0 අතර වර්ධනයක් අත්කර ගනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2017 වසරේ ආර්ථික වර්ධනය සියයට 5.5 - 6.0 අතර අගයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**උද්ධමනය** මඳ වශයෙන් ඉහළ යෑමේ නැඹුරුවක් පැවතිය ද 2016 වසර තුළ දී අඛණ්ඩව පහළ මට්ටමක පැවතුණි. අයහපත් කාලගුණ තත්ත්වයන් හා රජයේ බදු ප්‍රතිපත්තියට සිදු කළ සංශෝධන හේතුවෙන් සැපයුම් අංශයට ඇති වූ පීඩනය උද්ධමනය ඉහළ යාම කෙරෙහි යම් පමණකට බලපෑවේය. පෙර පැවති ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ වැටුප් මිල ගණන් ඉහළ යාම උද්ධමනය මත ඉල්ලුම් අංශයෙන් යම් පීඩනයක් ඇති කිරීමට හේතු විය. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද. 2006/07 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව ගණනය කරනු ලබන මතුපිට උද්ධමනය 2015 දෙසැම්බර් මාසයේ දී වාර්තා කළ සියයට 2.8 ට සාපේක්ෂව 2016 දෙසැම්බර් මාසයේ දී සියයට 4.1 ක් විය. ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද. 2013 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව ගණනය කරනු ලබන මතුපිට උද්ධමනය 2015 අවසානයේ දී පැවති සියයට 4.2 ට සාපේක්ෂව 2016 නොවැම්බර් මාසයේ දී සියයට 4.1 ක් විය. මේ අතර, ආර්ථිකයේ ඉල්ලුම් තත්ත්වයන් තවදුරටත් ඉහළ යාම සහ වසරේ අග භාගයේ දී බදු ව්‍යුහයට සිදු කරන ලද සංශෝධන පිළිබිඹු කරමින් මූලික උද්ධමනය 2016 වසරේ දී අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, සමස්ත උද්ධමනය අප

ඉලක්ක කළ ආකාරයෙන් ම සියයට 4 - 6 ක් අතර වූ මැදි තනි අගයක පැවතුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ **මූලික උද්ධමනය,** 2015 වසර අවසානයේ දී පැවති සියයට 4.5 ට සාපේක්ෂව 2016 වසර අවසානයේ දී සියයට 6.3 ක් දක්වා ඉහළ ගිය අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මූලික උද්ධමනය 2016 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 6.8 ක් විය.

කාලීන වශයෙන් හඳුන්වා දෙන ලද පූර්ව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාර ලෙස ඉහළ වේගයකින් වර්ධනය වූ **මුදල් සමස්තවල** වර්ධනය පහළ වැටුණු අතර, මූලික වශයෙන් **වෙළඳපොළ පොලී අනුපාතික** ඉහළ යාමේ බලපෑම පිළිබිඹු කරමින් **පෞද්ගලික අංශයට ලබා දුන් ණය** වර්ධනයෙහි පහළ යාමක් පෙන්නුම් කළේය.

ශ්‍රී ලංකාවේ **විදේශීය වෙළඳාමේ ක්‍රියාකාරිත්වය** වසරේ අග භාගය වන විට යම් වර්ධනයක් පෙන්නුම් කළ ද 2016 වසර තුළ දී මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. 2016 වසරේ මුල් මාස දහය තුළ දී අපනයන ආදායම සියයට 2.6 කින් පහළ ගිය අතර ආනයන වියදම සියයට 0.2 ක ආන්තික අඩු වීමක් පෙන්නුම් කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2016 වසරේ මුල් මාස දහය තුළ දී වෙළඳ ගිණුමේ සමුච්චිත හිඟය එ.ජ.ඩොලර් බිලියන 7.2 ක් දක්වා සියයට 3.7 කින් වර්ධනය විය. විදේශීය අංශය ශක්තිමත් කරමින් 2016 වසරේ මුල් මාස එකොළහ තුළ **සංචාරක අංශයේ ඉපැයීම්** එ.ජ.ඩොලර් බිලියන 3.0 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව සියයට 14.7 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2016 වසරේ මුල් මාස එකොළහ තුළ දී **සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** එ.ජ.ඩොලර් බිලියන 6.6 ක් දක්වා සියයට 3.1 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම ප්‍රවණතා හේතුවෙන් 2016 වසරේ මුල් මාස නවය තුළ **ජංගම ගිණුමේ හිඟය** මගින් පිළිබිඹු වන පරිදි **ඉතුරුම්-ආයෝජන පරතරය** පටු විය. රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි **විදේශ ආයෝජනවල** ශුද්ධ ගලායාමක් දක්නට ලැබුණු අතර, රජයේ දිගුකාලීන ණයවල ශුද්ධ ලැබීමක් වාර්තා විය. මේ අතර, රටේ ගෙවුම් තුලන තත්ත්වය ශක්තිමත් කිරීමට හා රජයේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට සහාය ලබා ගැනීමේ අරමුණින්, 2016 වසර තුළ දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ **විස්තීර්ණ ණය පහසුකම** යටතේ වසර තුනක් සඳහා විශේෂ ගැණුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 1.1 ක් (ආසන්න වශයෙන් එ.ජ.ඩොලර් බිලියන 1.5 ක්) වන වැඩසටහනකට එළැඹෙන ලදී. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, **දළ නිල සංචිත** ප්‍රමාණය 2016 වසර අවසානය වන විට එ.ජ.ඩොලර් බිලියන 6.0 ක මට්ටමේ පවතී යැයි ඇස්තමේන්තු කර ඇත. තවද, 2016 වසරේ ඇතැම් මාසවල රුපියල අවප්‍රමාණය වීම සඳහා සැලකිය යුතු පීඩනයක් පැවතිය ද, පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ දී රුපියල

ස්ථාවර මට්ටමක පැවතුණි. 2016 වසර තුළ දී එය සියයට 3.8 කින් අවප්‍රමාණය විය.

2016 වසරේ **රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය** සවිමත් කිරීම කෙරෙහි යොමු වී පැවතුණි. රජයේ දැඩි පරිශ්‍රමය හේතුවෙන් ඇති වූ ධනාත්මක බලපෑම පිළිබිඹු කරමින් 2016 වසරේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය වැඩිදියුණු විය. රජයේ ආදායම ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවති අතර රජයේ වියදම අපේක්ෂිත මට්ටමේ පවත්වා ගත හැකි විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.4 ක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අයවැය හිඟය පිළිබඳ ඉලක්කය, 2016 වසරේ දී අත්කර ගෙන ඇති බවට රජය විශ්වාස කරන අතර, එය 2017 වසරේ දී සියයට 4.6 ක් දක්වා තවදුරටත් අඩු කිරීමට ද බලාපොරොත්තු වේ.

බලපත්‍රලාභී බැංකුවලට අදාළ නියාමන හා අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා **ජාත්‍යන්තර සම්මතයන් හා මනා පරිචයන්ට** අනුගතව මහ බැංකුව විසින් 2016 වසරේ දී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. **බැංකු අංශයේ මූලික දර්ශක** යහපත් මට්ටමක පැවැති අතර, දැඩි රාජ්‍ය මූල්‍ය හා සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ග මධ්‍යයේ බැංකු නොවන අංශය කටයුතු කළේය.

මේ අතර, මූල්‍ය අංශයේ වර්ධනය වන හා වෙනස් වන ගෙවීම් අවශ්‍යතාවන්ට පහසුකම් සලසමින්, රටේ **ජාතික ගෙවීම් පද්ධති** කිසිදු ප්‍රධාන බිඳ වැටීමකින් තොරව ඉහළ කාර්යක්ෂමතාවයකින් හා සුරක්ෂිතතාවයකින් යුතුව සුමට ලෙස ක්‍රියාත්මක විය.

# 3. 2017 වසර සහ ඉදිරිය සඳහා මුදල් ප්‍රතිපත්ති උපායමාර්ගය සහ ප්‍රතිපත්ති

අපගේ අරමුණු ඉටු කර ගැනීමේ දී **තාර්කික සහ විධිමත් සාර්ව ආර්ථික රාමුවක්** උපයෝගී කර ගැනීම වැදගත් වේ.

සමස්ත සාර්ව ආර්ථික රාමුවෙහි මූලික අංග අතුරින් මිල ස්ථායීතාව පවත්වා ගැනීම වැදගත් අංගයක් වේ. **මිල ස්ථායීතාව** යනු රටෙහි තිරසාර, දිගුකාලීන ආර්ථික වර්ධනයක් සහ සේවා නියුක්තියක් සඳහා උපකාරී වන අඩු, ස්ථායී සහ පුරෝකථනය කළ හැකි මට්ටමේ උද්ධමනයක් පවත්වා ගැනීමයි. නාමික පොලී අනුපාතික පහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා මිල ස්ථායීතාව උපයෝගී වන අතර, එය පාරිභෝගික සහ නිෂ්පාදක යන දෙපිරිසටම සිය ආර්ථිකමය තීරණ නිශ්චිතව හා විශ්වාසයකින් යුතුව ගැනීමට හැකියාව ලබා දෙමින්, **ආර්ථිකයට එහි උපරිම වර්ධන හැකියාව** කරා ළඟා වීමට උපකාරී වනු ඇත. එම නිසා, නූතන මහ බැංකු විසින්, තිරසාර වර්ධනය සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස මිල ස්ථායීතාව ස්ථාපිත කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත.

ඒ අනුව, ප්‍රධාන අංශ තුනකින් සමන්විත වන **මනාව සැලසුම් කරන ලද සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවක්** ස්ථාපිත කිරීම සඳහා මහ බැංකුව සහ රජය කටයුතු කරමින් සිටින බව පෙන්වා දීමට මම කැමැත්තෙමි.

මැදිකාලීනව රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින්, නව **රාජ්‍ය මූල්‍ය රාමුවක්** ඔස්සේ අයවැය ක්‍රියාකාරකම්වල දිගුකාලීනව දක්නට ලැබුණු දුර්වලතා මඟහරවා ගැනීම සඳහා රජය විසින් තීරණාත්මක ක්‍රියාමාර්ග ගනිමින් තිබේ. මෙම රාමුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම තුළට ද ඇතුළත් කර ඇත.

මෙම ප්‍රයත්නයන්, මුදල් ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ප්‍රතිපත්ති රාමු ද්විත්වයට අදාළව මහ බැංකුවේ අපේක්ෂිත වැඩිදියුණු කිරීම් සඳහා සහාය වනු ඇත.

(අ) **නම්‍යශීලී උද්ධමන අගයක් ඉලක්ක කිරීමේ (Flexible Inflation Targeting)** රාමුව ක්‍රියාත්මක කිරීම හරහා මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීම.

(ආ) වෙළඳපොළ පදනම් කරගත් විනිමය අනුපාතික ක්‍රමයක් ස්ථාපිත කිරීම අරමුණු කර ගනිමින් **විනිමය අනුපාතික කළමනාකරණය සඳහා නිසි හා පුළුල් ලෙස පිළිගත් රාමුවක්** හඳුන්වා දීම.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීර්ණ ණය පහසුකම යටතේ සිදු කරනු ලබන පුළුල් පදනමකින් යුතු ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග මෙම ප්‍රයත්න තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

මිල ස්ථායීතාව ඇති කරලීම සඳහා 1980 ගණන්වල සිට මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස **මුදල් ඉලක්කකරණය** උපයෝගී කරගනු ලැබීය. මෙම රාමුව තුළ මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමේ දී ප්‍රධාන අතරමැදි විචල්‍ය ලෙස මුදල් සමස්ත භාවිතා කරන ලද අතර මුදල් සමස්ත පාලනය කිරීම තුළින් අවසාන අරමුණ වූ මිල ස්ථායීතාව ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ලදී. මෙම මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් සලකනු ලැබූ අතර, අතරමැදි ඉලක්කය ලෙස පුළුල් මුදල් භාවිතා කරන ලදී.

කෙසේ වෙතත්, මූල්‍ය නවෝත්පාදන සහ මුදල් හා උද්ධමනය අතර සම්බන්ධය දුර්වල වෙමින් පවතින අතරම, මුදල් ඉල්ලුම් ශ්‍රිතය අස්ථාවර වීම හේතුවෙන් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී මුදල් ඉලක්ක කිරීම ප්‍රයෝජනවත් නොවන රාමුවක් බවට පත් වී ඇත.

එහෙයින්, මුදල් ඉලක්ක කිරීමේ රාමුව භාවිතා කළ රටවල් උද්ධමනය ඉලක්ක කිරීම වැනි නව රාමු භාවිතය සඳහා අවතීර්ණ වී ඇත.

මෙම ගෝලීය ප්‍රවණතාවට අනුරූපව ශ්‍රී ලංකා මහ බැංකුව ද වසර කිහිපයක සිට සිය මුදල් ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කරමින් පවතී.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ඉලක්ක කිරීමේ රාමුව වෙනුවට **නම්‍යශීලී උද්ධමන ඉලක්ක කිරීමේ රාමුව** වෙත ක්‍රමක්‍රමයෙන් අවතීර්ණ වන බව නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

මෙම වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ, ආර්ථික වර්ධන අරමුණුවලට සහ විනිමය අනුපාතික කළමනාකරණයේ නම්‍යශීලිත්වයට සහාය දෙන අතරම, **මැදි කාලීනව උද්ධමනය මැදි තනි අගයක** පවත්වා ගැනීමට මහ බැංකුව අරමුණු කරයි.

සංඛ්‍යාත්මක උද්ධමන ඉලක්කයක් ප්‍රකාශයට පත් කිරීම, ඉදිරි දැක්මකින් යුතුව මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමට ඉවහල් වන මැදි කාලීන උද්ධමන පුරෝකතන උපයෝගී කර ගැනීම හා ඉහළ මට්ටමේ විනිවිදභාවය හා වගවීම යන කරුණු උද්ධමන ඉලක්ක කිරීමේ රාමුවක ප්‍රධාන ලක්ෂණ අතර වේ.

උද්ධමන ඉලක්ක කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් ලෙස අර්ථ දැක්විය හැකිය. ඒ සඳහා සමස්ත **මුදල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණය** පිළිබඳ පුළුල් අවබෝධයක් තිබීම අවශ්‍ය වන අතර උද්ධමන ඉලක්ක කිරීමේ රාමුව, ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල සිට අන්තර් බැංකු පොලී අනුපාතික සහ දිගු කාලීන පොලී අනුපාතික දක්වා මනාව ස්ථාපිත වූ සම්බන්ධතාවයක් මත පදනම් වේ. මහ බැංකුවේ මෙම වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති ඉලක්ක කිරීමේ රාමුව යටතේ, **මෙහෙයුම් ඉලක්කය** වන **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** අපේක්ෂිත දිශාවට හැසිරවීම සඳහා වෙළඳපොළ පදනම් කරගත් උපකරණ විශේෂයෙන්ම, **ප්‍රතිපත්ති පොලී**

**අනුපාතික** සහ **විවට වෙළඳපොළ ක්‍රියාකාරකම්** භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. මෙය ඵලදායී මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලියක් තහවුරු කරනු ඇත.

මෙම වැඩිදියුණු කළ රාමුව යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් සමස්ත සඳහා ඉලක්ක ප්‍රසිද්ධ නොකරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා මඟපෙන්වීමක් වශයෙන්, ආර්ථිකයේ පුළුල් ද්‍රවශීලතා තත්ත්ව පිළිබිඹු කරන පුළුල් මුදල් ($M_{2b}$) තවදුරටත් **අතරමැදි දර්ශක විචල්‍ය** ලෙස කටයුතු කරනු ඇත.

නව මුදල් ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා කෙටි කාලීන මෙන්ම මැදි කාලීන ව්‍යුහාත්මක පුරෝකතන මෙවලම් හා ශිල්පීය ක්‍රම භාවිතා කරමින්, **උද්ධමන පුරෝකථන** ද ඇතුළත් **සාර්ව ආර්ථික පුරෝකථන** සිදු කිරීම ශක්තිමත් කරමින් තිබේ. මෙම ප්‍රයත්නයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ තාක්ෂණික හැකියාවන් වැඩි දියුණු කිරීමට අඛණ්ඩව පියවර ගනිමින් තිබේ.

සිය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා පුරෝකථන ආකෘති සකස් කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සාර්ව ආර්ථික පුරෝකථනය, පුරෝකථන ආකෘති නිර්මාණය හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා තාක්ෂණික සහාය ලබා ගනිමින් සිටී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි තාක්ෂණික සහාය ඇතිව, මැදිකාලීනව ව්‍යුහාත්මක පුරෝකථන ආකෘති මත පදනම් වූ **පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (FPAS)** සකස් කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ක්‍රමවේදයකට ප්‍රවේශ වීමට ඒකාබද්ධ ප්‍රයත්නයක් දරා ඇත. මෙම පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය, දත්ත සහ විනිශ්චයන් සුදුසු ආකාරයෙන් හා තර්කානුකූල ලෙස යොදා ගත හැකි මැදි කාලීන පූර්ව ප්‍රතිපත්ති විශ්ලේෂණ ක්‍රමවේදයකි.

මෙම පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය පුරෝකථනය කිරීම සහ විශ්ලේෂණය සඳහා මූලික මට්ටමේ අර්ධ-ව්‍යුහාත්මක **කාර්තුමය පුරෝකථන ආකෘතියක් (Quarterly Projection Model)** සැකසීම දැනටමත් අවසන් කර ඇත.

මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය පුරෝකථන ආකෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනික වෙනස්කම් කිහිපයක් ද සිදු කරමින් සිටී. මේ සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ වෙනමම **ආකෘතිකරණ හා පුරෝකථන අංශයක්** ස්ථාපනය කර ඇති අතර, කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලබා දෙන අතර, අවශ්‍ය කටයුතු වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් සිටී.

විශේෂයෙන්ම, අපි මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ වෙනස්කම් කිහිපයක් හඳුන්වා දීමට අදහස් කරමු. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව සිය **මුදල් ප්‍රතිපත්ති කමිටුවේ රැස්වීම් (MPC)** සංඛ්‍යාව දැනට **වසරකට** පවත්වන රැස්වීම් 12 සිට **8 දක්වා** අඩු කිරීමට සැලසුම් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ආර්ථිකයේ නවතම ප්‍රවණතා විශ්ලේෂණය කිරීමට සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට පුළුල් සහ පූර්වගාමී විවරණ සැපයීමට පහසු වන පරිදි ආකෘතිකරණය මත පදනම් වන සාර්ව ආර්ථික පුරෝකතන සැකසීම සඳහා සති 5-6 ක පමණ කාලයක් ලැබෙනු ඇත.

මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළ ඉහත වැඩිදියුණු කිරීම් 2017 වසර අවසන් වීමට පෙර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාවලියේ දී මැදි කාලීනව හඳුන්වා දීමට නියමිත නව වෙනස්කම්වලට ඉඩ සලසා දීම සඳහා මුදල් නීති පනත සංශෝධනය කරනු ඇත.

තවද, කීර්තිමත් විද්වතුන්, වෘත්තිකයන් මෙන්ම පෞද්ගලික අංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත **මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුව (MPCC)** 2017 දී නැවතත් හඳුන්වා දීමට අපි අදහස් කරමු. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩා හොඳින් සිදු කිරීමේ දී මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුවේ අදහස් හා යෝජනා ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

මීට අමතරව, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සම්බන්ධයෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති හා රෙගුලාසි සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ අදහස් ලබා ගැනීමට තවත් **වැදගත් උපදේශක කමිටු දෙකක්** පිහිටුවීමට අපි අදහස් කරමු. සුදුසු මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී එවැනි කමිටුවල අදහස් හා යෝජනා උපකාරී වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

මුදල් අංශයේ ප්‍රවණතාවයන් අඛණ්ඩව වඩාත් සමීප ලෙස අධීක්ෂණය කරන අතර, අපේක්ෂිත ආර්ථික වර්ධනයට උපකාරී වනු පිණිස ස්ථාවර මුදල් තත්ත්වයන් හා මිල ස්ථායීතාව තහවුරු කිරීම සඳහා අනෙකුත් **සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ගවල** සහයෝගය ඇතිව **කාලීන සහ ඵලදායී මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග** ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

එමෙන්ම, අපි කෙටිකාලීන පොලී අනුපාතික අපේක්ෂිත මාර්ගයක පවත්වා ගැනීම සඳහා **ද්‍රවශීලතා කළමනාකරණ** ක්‍රියාවලින්හි අඛණ්ඩව සහ ක්‍රියාශීලීව නිරත වන්නෙමු.

මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා **ස්ථාවර පොලී අනුපාතික හා විචල්‍ය පොලී අනුපාතික වෙන්දේසි හඳුන්වා දීම** සහ වෙනත් රටවල අත්දැකීම් සහ වෙළඳපොළ අවශ්‍යතාවලට අනුකූලව වෙන්දේසිවල අවශ්‍යතාවය හා ශක්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව

**වෙන්දේසි ක්‍රමවේද වැඩිදියුණු කිරීම** වැනි විවට වෙළඳපොළ කටයුතු සඳහා වන පියවර හඳුන්වා දීමට බලාපොරොත්තු වෙමු. විවට වෙළඳපොළ කටයුතු ශක්තිමත් කිරීම සඳහා අපි විකල්ප උපකරණ පිළිබඳව ද අධ්‍යයනය කරන්නෙමු.

මෙම ක්‍රියාමාර්ග පිළිබිඹු කරමින් **මැදි කාලීනව උද්ධමනය මැදි තනි අංකයක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඒ අනුව, වසර කිහිපයක් පුරා අඩු මට්ටමක පැවති උද්ධමන වාතාවරණය එලෙසම පවත්වා ගනිමින් මැදි කාලීනව උද්ධමනය **සියයට 4-6 අතර පරාසයක** පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ අපේක්ෂිත උද්ධමන ඉලක්ක සීමා සමඟ ද අනුකූල වේ.

**සාර්ව ආර්ථික සංඛ්‍යාලේඛන** සකස් කිරීමේ ක්‍රමවේද ජාත්‍යන්තර ප්‍රමිතියකට අනුව සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හැකියාව වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩවම උත්සාහ ගනු ඇත. මෙය, වඩාත් ඵලදායී ලෙස ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා වැදගත් වන ආර්ථික විශ්ලේෂණ සිදු කිරීම දිරි ගන්වන අතරම මුදල් ප්‍රතිපත්තියේ සහ ප්‍රතිපත්ති සන්නිවේදනයේ විනිවිදභාවය වැඩිදියුණු කරනු ඇත.

එමෙන්ම, සවිස්තරාත්මක ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී වඩාත් යෝග්‍ය සංඛ්‍යාලේඛන දත්ත ලබා ගැනීම පිණිස **දේපල මිල** සඳහා නව දර්ශක හඳුන්වා දීමටත්, **වැටුප් දර්ශක** නවීකරණය කිරීමටත්, පෞද්ගලික අංශයේ වර්ධන ප්‍රවණතා මනා ලෙස ග්‍රහණය කිරීම සඳහා දැනට සිදු කරන සමීක්ෂණවල ආවරණ පරාස පුළුල් කිරීමටත් බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්තිමය තීරණ වෙළඳපොළ සහභාගිකරුවන්ට සහ පොදු ජනතාවට වඩාත් පැහැදිලි සහ මනාව තේරුම්ගත හැකි වන පරිදි සන්නිවේදනය කිරීමට විවිධ මාධ්‍ය ඔස්සේ ක්‍රියා කරනු ඇත. තවද, **ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම** මගින් ගතික සහ අන්තර් ක්‍රියාකාරිත්වයෙන් යුතු ඉහළ ගුණාත්මක තොරතුරු ලබා දීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතර, අතීතයේ දී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය නැවතත් ක්‍රියාත්මක කරමින් මුදල් ප්‍රතිපත්ති නිවේදන, මුදල් ප්‍රතිපත්ති දැනුම් දීමේ ඉදිරි දින දර්ශනයට අනුව සිදු කිරීමට බලාපොරොත්තු වන අතර 2017 වසර සඳහා වන දින දර්ශනය පහත දක්වා ඇත.

**මුදල් ප්‍රතිපත්ති නිවේදන - 2017**

| | |
|---|---|
| 1 | පෙබරවාරි 7, අඟහරුවාදා |
| 2 | මාර්තු 24, සිකුරාදා |
| 3 | මැයි 9, අඟහරුවාදා |
| 4 | ජූනි 27, අඟහරුවාදා |
| 5 | අගෝස්තු 3, බ්‍රහස්පතින්දා |
| 6 | සැප්තැම්බර් 26, අඟහරුවාදා |
| 7 | නොවැම්බර් 7, අඟහරුවාදා |
| 8 | දෙසැම්බර් 28, බ්‍රහස්පතින්දා |

වෙනස් වන ගෝලීය වෙළඳපොළ තත්ත්වයන් සහ ද්විත්ව හිඟයක් සහිත රටක් ලෙස ශ්‍රී ලංකාවට පවතින අවදානම, විදේශීය අංශයෙන් ඇති වන පීඩනයන්ට මුහුණ දීම සඳහා **නම්‍යශීලී විනිමය අනුපාත ප්‍රතිපත්තියක්** පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. විදේශීය සංචිත භාවිතයෙන් **අධිප්‍රමාණය වූ විනිමය අනුපාතයක්** පවත්වා ගැනීම තිරසාර නොවන බව මෑතකාලීන අත්දැකීම් මගින් පැහැදිලිව පෙන්නුම් කර ඇත. 2011-12 කාලයේ දී මහ බැංකුව වෙළඳපොළ මැදිහත්වීම් තුළින් එ.ජ.ඩොලර් බිලියන 4 ක පමණ විදේශීය සංචිත වැය කොට **රුපියලේ විදේශීය අගය ආරක්ෂා කිරීම සඳහා ගත් අඛණ්ඩ උත්සාහයෙන් පසුව** ද රුපියල සියයට 14 කින් පමණ අවප්‍රමාණය විය. එබැවින්, මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරන ලද වෙළඳපොළ මැදිහත්වීම් තුළින් කෘත්‍රිම ලෙස ස්ථාවර විනිමය අනුපාත කාලයක් පුරා පවත්වා ගෙන ගිය ද ඉන් අනතුරුව සිදු කළ යුතු වඩාත් අහිතකර ගැලපීම් සිදු කිරීම වැළැක්වීමට ද **වෙළඳපොළ පදනම් කරගත් සුමට විනිමය අනුපාතයක්** පවත්වා ගැනීම මගින් හැකි වනු ඇත. ඒ හා සමාන අත්දැකීමකට අනුව, 2015 දී අප සතු වූ සංචිතවලින් එ.ජ.ඩොලර් බිලියන 2.1 ක් වැය කිරීමෙන් පසුව ද රුපියල සියයට 6.5 කින් අවප්‍රමාණය විය. මෙසේ, අවප්‍රමාණය වීමට නියමිත රුපියල ආරක්ෂා කර ගැනීමට දරන නිෂ්ඵල උත්සාහයක් ලෙස වැඩි වශයෙන් ණය ගැනීම්වලින් සමන්විත වූ රටේ විදේශීය සංචිත විශාල ප්‍රමාණයක් අපතේ යැවීම පැහැදිලි ලෙසම තිරසාර නොවේ. මෙම ප්‍රවණතාවය නැවැත්වීමට සහ තිරසාර විදේශ විනිමය ලැබීම් ඔස්සේ විදේශ සංචිත ශක්තිමත් කර ගැනීම ඇරඹීමට කාලය එළැඹී තිබේ.

බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීම, එක්සත් ජනපදයේ මෑතකාලීනව පැවැති ජනාධිපතිවරණය, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාත ඉහළ නැංවීම, යුරෝපා රටවල් වන ප්‍රංශයේ හා ජර්මනියේ ඉදිරියේ දී පැවැත්වෙන මැතිවරණ, චීන ආර්ථිකය මන්දගාමී වන බවට පවතින පුරෝකථන මෙන්ම ඉන්දියාව, ජපානය, රුසියාව හා මැදපෙරදිග ඇතුළු ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික තත්ත්වයන් වැනි **ගෝලීය ප්‍රවණතා** ද දේශීය ආර්ථිකය මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත.

එක්සත් ජනපදයේ පොලී අනුපාතික සාමාන්‍යකරණය කිරීම, ඛනිජතෙල් මිල ගණන් සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන ප්‍රවාහ මගින් ඇති වන බලපෑම මෙහිදී විශේෂයෙන් වැදගත් වනු ඇත.

**රජයේ බදු ව්‍යුහය** සංශෝධනය කිරීම සහ කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇති වන **සැපයුම් හිඟයන්** මෙන්ම **ගෝලීය පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ඉහළ යාමට පවතින හැකියාව** හේතුවෙන් ඇති විය හැකි කම්පනයන් මගින් මිල මට්ටම්වල තාවකාලික වෙනස්වීම් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, දැනට පවතින නියඟ තත්ත්වය අඛණ්ඩව පැවතියහොත්, එය මිල මට්ටම් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කිරීමටත්, එමගින් විශේෂයෙන්ම, කෘෂිකර්මය සහ විදුලිබල උත්පාදනය ආශ්‍රිත ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර අයුරින් බලපෑමටත් ඉඩ ඇත.

අතීතයේ දී මෙන්ම, මිල ගණන් මත සැපයුම් අංශයෙන් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා රජය විසින් කාලීන පියවර ගනු ඇතැයි ද එමගින් සාමාන්‍ය ජනතාව තුළ පවතින අහිතකර **උද්ධමන අපේක්ෂාවන්** අවම වනු ඇතැයි ද බලාපොරොත්තු වේ.

ඒ අනුව, සුදුසු ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ කාලීනව ගනු ලබන සැපයුම් අංශයේ ක්‍රියාමාර්ගවල ආධාරයෙන් මැදි කාලීනව උද්ධමන අපේක්ෂාවන් **බොහෝ දුරට නොවෙනස්ව පවතිනු ඇතැයි** අපේක්ෂා කෙරේ.

# 4. 2017 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති

මූල්‍ය පද්ධතිය, සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීමට සහ එමගින් රටෙහි ශක්තිමත් ආර්ථික කාර්යසාධනයට පහසුකම් සැලසීම සඳහා වැදගත් වේ. විශේෂයෙන්ම, ආර්ථිකයන් බොහෝ නවීන ආකාරයෙන් වර්ධනය වන බැවින් **පුළුල්,** ගැඹුරු **සහ ද්‍රවශීලතාවයෙන් යුක්ත මූල්‍ය පද්ධතියක් පැවැතීම අත්‍යවශ්‍ය වේ.**

ස්ථායී මූල්‍ය පද්ධතියක් ඉතිරිකරන්නන් හා ආයෝජකයන්ට විශ්වාසදායී සහ එම පාර්ශ්වයන්ගේ මූල්‍ය කටයුතු සඳහා සතුටුදායක පරිසරයක් ඇති කරන අතර, එය මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සඳහා උපකාරී වෙමින් ආයෝජන සහ ආර්ථික වර්ධනය ක්‍රමයෙන් ප්‍රවර්ධනය වීමට දායක වන අතර මූල්‍ය අතරමැදිකරණයේ කාර්යක්ෂමතාව ධෛර්යමත් කිරීම සහ ආර්ථිකයෙහි සම්පත් බෙදාහැරීම වර්ධනය කරමින් වෙළඳපොළවල ඵලදායී සහ කාර්යක්ෂම මෙහෙයුම් ඇති කිරීම සඳහා ද දායක වේ.

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව, මූල්‍ය පද්ධතියෙහි ගනුදෙනු කරන **මහජනතාවගේ විශ්වාසය** මත පදනම් වන අතර, එය විවිධ දේශීය සහ විදේශීය සංවර්ධනයන් හේතුවෙන් ඇති වන අවදානම් අවශෝෂණය කර ගැනීමට මූල්‍ය පද්ධතියේ ඇති ප්‍රධාන සංරචකයන්ගේ **ශක්තිමත් බව හා ඔරොත්තු දීමේ හැකියාව** මත රඳා පවතී.

මහ බැංකුව මූල්‍ය ආයතනවල සියලුම ප්‍රධාන අංශවල **නියාමනය සහ අධීක්ෂණය** මාර්ගයෙන් මූල්‍ය පද්ධතියෙහි ශක්තිමත් බව, කාර්යක්ෂමතාව සහ ස්ථායීතාව අඛණ්ඩව සුරක්ෂිත කරනු ලබයි. එමෙන්ම, **ශක්තිමත් හා සුරක්ෂිත ගෙවීම් සහ පියවීම් පද්ධතියක්** සහතික කිරීමට මෙන්ම **අවදානම් කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීමට** සහ **මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කරමින්** මූල්‍ය පද්ධතිය තුළ **මනා සාංගමික යහපාලන ප්‍රමිතීන් සහ භාවිතයන්** ඇති කිරීමට ද අඛණ්ඩව කටයුතු කරමින් සිටී.

අපගේ මැදි කාලීන සමස්ත ඉලක්කය වන්නේ, මෙම අංශය තුළ පැනනගින අයහපත් තත්ත්වයන් හඳුනා ගැනීම, ඒවා කල්තියා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහ මූල්‍ය ආයතන, වෙළඳපොළවල්, යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණ ජාල තවදුරටත් ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග රාශියක් ක්‍රියාත්මක කිරීම හරහා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීමයි.

අපගේ මැදි කාලීන සැලසුම වනුයේ, රටේ පුළුල් ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි කෘෂිකර්මය, යටිතල පහසුකම්,

විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ආශ්‍රිත නිෂ්පාදන සහ වෙළඳාම ඇතුළත් සියලුම ආර්ථික අංශයන්ට උපරිම **මූල්‍ය නිපැයුම් සහ සේවා** රැසක් ප්‍රදානය කිරීමට හැකි මූල්‍ය පද්ධතියක් අත්පත්කර ගැනීමයි. මෙය ළඟාකර ගැනීම සඳහා අපට හොඳින් සැලසුම් කරනු ලැබූ හා බලාපෙරොත්තු සහගත **මූල්‍ය අංශ සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක්** අවශ්‍ය වන අතර නවීන, ශක්තිමත් හා තරගකාරී බවින් යුතු මූල්‍ය පද්ධතියක් ඇති කිරීමේ දර්ශනයක් සහිතව මූල්‍ය පද්ධතිය ආශ්‍රිත ප්‍රතිපත්ති හරහා එම ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු වේ.

ලියාපදිංචි බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන් ඇතුළත් සියලුම මූල්‍ය ආයතනවලට අදාළව **නියාමන රාමුව** ශක්තිමත් කිරීම සඳහා මූලිකත්වය දී කටයුතු කිරීමට අප බලාපොරොත්තු වේ. එමගින්, මූල්‍ය අංශයේ ස්ථායීතාව තවදුරටත් සහතික කරනු ලබන අතර, වර්ධනය වන ව්‍යාපාරික පරිසරයක් තුළ අනපේක්ෂිතව සිදුවිය හැකි අභියෝගවලට සුරක්ෂිතව හා ශක්තිමත්ව මෙම ආයතනයන්ට මුහුණ දීමට ඇති හැකියාව ප්‍රවර්ධනය කරයි.

මේ සම්බන්ධයෙන්, මහ බැංකුව 2017 වසර සහ ඉන් ඉදිරියට පහත සඳහන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

පවතින **බැංකු පනතට** අවසාන සංශෝධනය **2006** දී සිදු කළ අතර, එතැන් සිට බැංකු පද්ධතියෙහි විකාශනය දේශීයව සහ ජාත්‍යන්තරව සැලකිය යුතු වෙනසකට භාජනය වී ඇත. මෙම සංවර්ධනයන්ට අනුගතව පවතින තත්ත්වයන් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව සලකා බලමින් පවත්නා බැංකු පනතට සංශෝධන සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. ඒ අනුව, යෝජිත **බැංකු පනතට අදාළ සංශෝධන** මාර්ගයෙන් නියාමන සහ අධීක්ෂණ රාමුව නවීකරණය සහ ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරනු ඇත. මේ යටතේ, පනත සහ නිකුත් කළ විධිවිධාන උල්ලංඝණය කිරීමට අදාළව **මහ බැංකුවේ නීති බලාත්මක කිරීමේ අධිකාරී බලය** සවිබල ගැන්වීම සඳහා වන ප්‍රතිපාදන අප විසින් සලකා බලනු ඇත. මේ සම්බන්ධයෙන් **බැංකු අංශයේ අදහස්** ද ලබාගැනීමට අපි අපේක්ෂා කරන්නෙමු.

මෙම ප්‍රතිසංස්කරණවලට අනුකූලව යමින්, මධ්‍යකාලීනව සියලුම ප්‍රධාන නියාමනයන් විවරණය කිරීමට අපි අදහස් කරමු. මේ සම්බන්ධයෙන්, **බැංකු පනතේ ප්‍රධාන විධිවිධාන** වන කොටස් හිමිකාරිත්වය, විදේශීය ණය ලබාගැනීම් සහ සාංගමික යහපාලනය යනාදිය පිළිබඳව ද විවරණයක් කරනු ලබන අතර, එම විධිවිධාන අවශ්‍ය පරිදි සංශෝධනය කරනු ඇත.

රට තුළ මූල්‍ය ස්ථායීතාව පවත්වා ගෙන යෑම සහ නියාමන ප්‍රතිසංස්කරණ සමඟ අනුගතව

මහ බැංකුවේ අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඇති අවශ්‍යතාව අප විසින් හඳුනා ගෙන ඇත. ඒ අනුව, **බැංකුවල තිරසාරභාවය පිළිබඳ අවදානම් මැනීමේ දර්ශකය** මත පදනම්ව **බැංකු විමර්ශන ක්‍රියාදාමය** වැඩිදියුණු කිරීමට අප බලාපොරොත්තු වන අතර, එය මූලික වශයෙන්ම එක් එක් බැංකු සහ බැංකු අංශයේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ තිරසාරභාවය ඇති කිරීම සඳහා යොමු කෙරෙනු ඇත. ඒ අනුව, බැංකුවල තිරසාරභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම උදෙසා භාවිතා වන **ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දර්ශක** මත පදනම්ව දැනට පවත්නා අවදානම් මත පදනම් වූ අධීක්ෂණ රාමුව සංශෝධනය කිරීමට අපේක්ෂිතය. 2017 වසරේ පළමු කාර්තුව තුළ විශාල පරිමාණයේ බැංකු සඳහා පරීක්ෂණ මට්ටමින් අවදානම් මෙහෙයවීමේ දර්ශකයක් සකස් කරනු ලබන අතර, පසුව අනෙකුත් බැංකු කාණ්ඩයන්ගේ අවදානම් මෙහෙයවීම සඳහා ද අදාළ දර්ශකය පුළුල් කිරීමට අපේක්ෂිතය.

2018 වසරේ දී සියලුම පරීක්ෂණ වාර්තාවලට අවදානම් දර්ශකය ඇතුළත් කෙරෙනු ඇති අතර, මෙම දර්ශකය මත පදනම්ව අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමක් සිදු කිරීමට අපි අපේක්ෂා කරමු. 2019 වන විට සියලුම බැංකු සඳහා **පුළුල් පූර්ව අවදානම් තක්සේරු කිරීමක්** සිදු කරනු ඇති අතර, **අවදානම් මත පදනම් බැංකු විමර්ශන සැලැස්මක්** සකස් කෙරෙනු ඇත.

මීට අමතරව, බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතා සහ **බාසල් III ප්‍රාග්ධන සම්මතයන්ට** අනුකූලව බැංකුවල **ප්‍රාග්ධන තත්ත්වයන්** ශක්තිමත් කිරීමට අපි අදහස් කරන්නෙමු. බලපත්‍රලාභී බැංකුවලට අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් මහ බැංකුවේ 2014 පෙර දැක්මෙහි හඳුන්වා දුන් ප්‍රධාන ප්‍රතිපත්ති පියවර ලෙස බාසල් III ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සම්මතයන් හඳුනාගනු ලැබීය. **බාසල් III** යටතේ **ද්‍රවශීලතා ආවරණ අනුපාතය** ක්‍රියාවට නැංවීමට අදාළ විධිවිධාන අප විසින් 2015 අප්‍රේල් මාසයේ දී නිකුත් කොට ඇත.

**බාසල් III අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සිදු කිරීමට අදාළ විධානය** ඉතා මෑතක දී නිකුත් කළ අතර, බැංකු විසින් අදාළ අවශ්‍යතාවට අනුගත වීම 2017 වසරේ ජූලි 01 දින සිට ක්‍රමික කාලරාමුවක් මත ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය. තවද, ජාත්‍යන්තර කාලරාමුවකට අනුකූලව 2019 ජනවාරි 01 දින වන විට බාසල් III අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සියලුම බැංකු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

කම්පනයන්ට වඩාත් හොඳින් ඔරොත්තු දීමේ හැකියාවක් ඇති බැංකු අංශයක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව බැංකු විසින් ස්ථාවර අරමුදල් ප්‍රවාහයක් පවත්වා ගනු ඇතැයි අපි අපේක්ෂා කරමු. ඒ අනුව, බැංකු සඳහා **ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතයක්** හා **තෝලන අනුපාතයක්** හඳුන්වා දීමට අප විසින් සැලසුම්

කර ඇත. ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කළ යුතු අතර, ඊට අවශ්‍ය කරන බැංකු පනතේ විධිවිධාන ජාත්‍යන්තර කාලරාමුවකට අනුකූලව නිකුත් කරනු ඇත. තෝලන අනුපාතය ක්‍රියාවට නැංවීම මගින් බැංකු අංශයෙහි ඇති විය හැකි අතිරික්ත තෝලනය සීමා කිරීමට අදහස් කෙරේ. ඒ අනුව, 2017 දී අප විසින් තෝලන අනුපාතය යටතේ අනුකූලතා මට්ටම අධීක්ෂණය කිරීම ආරම්භ කිරීමට නියමිතය.

එමෙන්ම, ඵලදායී අධීක්ෂණය සඳහා වන පූර්ව අවශ්‍යතාවයක් ලෙස **අර්බුදවලට මුහුණ දීමේ සැලසුම් සහ ප්‍රතිසාධන හා නිවාරණ රාමුව** සකස් කර අවසන් කිරීම ද අපගේ අපේක්ෂාවයි. ඒ අනුව, බැංකුවල ප්‍රතිසාධන හා නිවාරණ රාමුව පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීමට නියමිත අතර, අපහසුතාවන්ට මුහුණ දෙනු ලැබූ බැංකු සහ සමස්ත බැංකු හා මූල්‍ය පද්ධතිය මත ඇති වන අයහපත් බලපෑම් අවම කිරීම පිණිස අවදානම් කළමනාකරණ රාමු ශක්තිමත් කිරීමට සහ නවීකරණය කිරීමට නියමිතය.

බැංකු අංශයේ සංවර්ධනයන් සහ **බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ** මාර්ගෝපදේශවලට අනුකූලව, වර්තමාන තක්සේරු ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට සහ විගණන කාර්යයේ ගුණාත්මක බව ඉහළ නැංවීම පිණිස සුදුසුකම්වලින් පරිපූර්ණ විගණකවරුන්ගේ මණ්ඩලයක් තෝරා ගැනීම සඳහා පවත්නා නිර්ණායක සහ යාන්ත්‍රණය විමර්ශනය කිරීමට පියවර ගනිමින් තිබේ.

මහ බැංකුව මෑත වර්ෂවල දී බැංකු නොවන මූල්‍ය ආයතනයන්ගේ අවදානම් කළමනාකරණය, සාංගමික යහපාලනය, ප්‍රාග්ධන ප්‍රාමාණ්‍යාත්මතාව සහ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා පුළුල් විචක්ෂණශීලී නියාමන රාශියක් හඳුන්වා දී ඇත. එම තත්ත්වය තවදුරටත් ඉදිරියට ගෙන යමින්**, බැංකු නොවන මූල්‍ය ආයතනවල පවත්නා නියාමන රාමුව** වැඩිදියුණු කරමින් මූල්‍ය අංශයේ ස්ථායීතාව ශක්තිමත් කිරීමට නියමිතය.

විශේෂයෙන්ම, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතනවල ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂිතය. ඒ අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් දැනට පවත්වා ගෙන යන ප්‍රාග්ධන අවශ්‍යතාව වන පිළිවෙළින් රුපියල් මිලියන 400 සහ මිලියන 300 ට වඩා වැඩි **අවම මූලික ප්‍රාග්ධනයක්** පවත්වා ගෙන යෑම අවශ්‍ය වනු ඇත. ගනුදෙනු සුමටව සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමට ක්‍රමික කාල රාමුවක් යටතේ එය පිළිවෙළින් රුපියල් බිලියන 2 ක් සහ රුපියල් බිලියන 1 ක් දක්වා ඉහළ නැංවීමට නියමිතය. මෙම අංශය තවදුරටත් ඒකාබද්ධ කිරීමට ව්‍යුහමය ආරක්ෂිත ප්‍රාග්ධනයක් ලෙස මෙය ප්‍රයෝජනවත් වනු ඇත. අවදානම් සඳහා සංවේදී දැනට පවත්නා

**ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව** වැඩිදියුණු කිරීමට අපේක්ෂිත අතර, එය ණය ගැනුම්කරුවන්ගේ අවදානම් පැතිකඩ, මෙහෙයුම් සහ ඉතා ඉක්මණින් විකිණීම සඳහා සිදු කරන ආයෝජනවල (trading book) වෙළඳපොළ අවදානම මූලික කරගත් වැඩපිළිවෙළක් වනු ඇත.

තවද, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ යහපාලන රාමුව ශක්තිමත් කිරීම පිණිස පවත්නා **සාංගමික යහපාලන විධානය** සඳහා සුදුසු ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇත.

**බැංකු නොවන මූල්‍ය ආයතනවල අවදානම් කළමනාකරණ රාමුව** ද ශක්තිමත් කිරීමට නියමිතය. **නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව** අක්‍රීය ණය සහ අත්තිකාරම් වෙනුවෙන් සිදුකරනු ලබන වෙන්කිරීම් සහ වර්ගීකරණයට අදාළව දැනට පවත්නා විධාන සංශෝධනය කිරීමට අපි කටයුතු කරන්නෙමු. මෙය නියාමනවලට අනුකූලව ප්‍රතිපාදන සිදුකරන සහ ගිණුම්කරණවලට අනුව සිදු වන හානිකරණය අතර පවත්නා වෙනසට අනුරූපීතාවක් ඇති කිරීම සඳහා දායක වේ. අනපේක්ෂිත ලෙස ඇති විය හැකි අනාවරණ පාලනය කිරීමට සහ ආයෝජන මත සිදු විය හැකි ඉහළ සංකේන්ද්‍රතා අවදානම් අඩු කිරීම පිණිස ලියාපදිංචි මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල **නිශ්චල වත්කම් තක්සේරු කිරීම්** සඳහා මාර්ගෝපදේශ ලබාදීමට නියමිතය. තවද, අතිරේක ද්‍රවශීලතා සංරෝධක ඇති කිරීමට මෙම අංශය සඳහා අවම ද්‍රවශීලතා අවශ්‍යතා තවදුරටත් වැඩි කිරීමට අපේක්ෂිතය.

වාර්ෂික විගණන ගිණුම්/කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ කාලීන විස්තර වාර්තා සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශනය කිරීම සඳහා නව නියාමන රාමුවක් හඳුන්වා දීම මගින් මෙම අංශයේ **අනාවරණ සහ විනිවිදභාවය** වැඩිදියුණු කිරීමට ද අපි පියවර ගන්නෙමු.

මෙහිදී අපගේ අරමුණ වන්නේ, කුමන හෝ **පද්ධතිමය අවදානමකින් තොර සමාගම් කිහිපයකින් යුත් ශක්තිමත් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක්** පවත්වා ගනිමින්, මූල්‍ය පද්ධතිය තුළ සමස්ත අවදානම් අඩුකර ගැනීමය. පවත්නා නියාමන රාමුවට සිදු කිරීමට යෝජිත වෙනස්කම් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ශක්තිමත් කිරීම පිණිස **අභ්‍යන්තරික වශයෙන් සිදුවන** (මෙම අංශය තුළින්ම ජනිත වන) **ඒකාබද්ධකරණයකට** යොමු වීම සඳහා මෙම සමාගම් උනන්දු කරවනු ලැබේ.

මීට අමතරව, 2017 වසරේ දී ප්‍රධාන වශයෙන්ම **ඒකාබද්ධකරණය සහ යළි ප්‍රාග්ධනීකරණය** කිරීම තුළින් අවදානමට ලක්ව ඇති මුදල් සමාගම්වල අපහසුතාවන් මගහැරවීම සඳහා කටයුතු කිරීම පිණිස බොහෝදුරට අවධානය යොමු කිරීමට නියමිතය. මූල්‍යමය ලෙස අසමත් වී ඇති මූල්‍ය සමාගම්වල වංචාකාරී සහ අකටයුතු

ක්‍රියාකාරකම්වල නිරත වන අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ විමර්ශනය කිරීම සඳහා **නීතිය බලාත්මක කිරීමේ ඒකකයක්** ස්ථාපිත කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

**තහනම් මූල්‍ය යෝජනා ක්‍රමවලට අදාළ නීති බලාත්මක කිරීමේ පවතින රාමුව** ශක්තිමත් කිරීමේ අදහසින් විමර්ශනවලට අදාළ නීති බලාත්මක කිරීමේ අධිකාරීන්ට සහාය වීමට සහ අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීමට, නීතිය, මූල්‍ය වංචා විමර්ශනයට අදාළ විගණන හැකියාව සහ ගිණුම්කරණය යන අංශවලට අදාළව විශේෂිත දැනුමකින් යුත් නිලධාරීන්ගෙන් සමන්විත ඒකකයක් ස්ථාපිත කිරීමට මහ බැංකුව අදහස් කරයි. මෙම ඒකකය නීත්‍යානුකූල නොවන තැන්පතු භාර ගන්නා ඒකකයන්ට අදාළ කටයුතු සමඟ ගනුදෙනු කරනු ඇත. මීට අමතරව, නීත්‍යානුකූල නොවන ආයෝජන ක්‍රමවලට සම්බන්ධ වීමේ ඇති භයානකකම සහ මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමට මහ බැංකුව විසින් බලය පවරා ඇති ආයතන පිළිබඳව ජනමාධ්‍ය සමඟ සම්බන්ධ වී ඵලදායී ලෙස මහජනයා දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා මහජනතාවගේ දැනුම්වත්බව වැඩි කිරීමට මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරනු ඇත.

රජයේ සුරැකුම්පත් අලෙවි කිරීම සහ වෙළඳපොළ නිර්මාණය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් **ප්‍රාථමික අලෙවිකරුවන්** විසින් සිදුකරනු ලබයි. තවද, රට තුළ පුළුල් ණය සුරැකුම්පත් වෙළඳපොළක් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රවණතාවක් ද ඇත. ඒනිසා, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මෙහෙයුම් නවීකරණය කිරීම සඳහා පැහැදිලිව ප්‍රකාශ කරන ලද ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට අවශ්‍යව ඇත. එවැනි ප්‍රතිපත්තියක් ඇති කිරීම, රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි ආයෝජනවල සුරක්ෂිත බව තවදුරටත් වැඩිදියුණු කිරීමට හේතු වේ. ඒ අනුව, අප **ප්‍රාථමික අලෙවිකරුවන්ගේ පවත්නා නියාමන රාමුව** දැනටමත් අධ්‍යයනය කර ඇති අතර, එම සොයාගැනීම් මත පදනම්ව මෙම වෙළඳපොළේ වත්මන් සංවර්ධනයන්ට අනුකූලව හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා සුදුසු නියාමන රාමුවක් හඳුන්වා දීමට අපේක්ෂිතය. එසේම, අවදානමට ලක් වූ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ද **ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක්** ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියෙහි සිදුවන සංවර්ධනයන් සමීපව අධ්‍යයනය කිරීම සඳහා මහ බැංකුවේ **සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව** ශක්තිමත් කෙරෙමින් පවතී. මේ සම්බන්ධයෙන්, සාර්ව විචක්ෂණ අධ්‍යයනය සඳහා වන ආයතනික රාමුව ශක්තිමත් කිරීමට අප බලාපොරොත්තු වන අතර, ඊට පහත සඳහන් සංවර්ධනයන් ඇතුළත් වේ. (1) මහ බැංකුවේ දැනට පවත්නා **ෆින්නෙට් තොරතුරු වාර්තාකරණ පද්ධතිය**

**(FInNet Data Reporting System)** භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම මගින් සාර්ව ආර්ථික සහ මූල්‍ය තොරතුරු එක්රැස් කිරීම, (2) මූල්‍ය ආයතනවල සිදුවිය හැකි අවදානම් සහ පද්ධතිමය අවදානම් ඇතිවන ආකාරයෙන් ගොඩනැගෙන **ආයතනික අන්තර් සම්බන්ධකම්වලින්** මූල්‍ය ස්ථායීතාවට **පද්ධතිමය වශයෙන් ඇති විය හැකි අනාරක්ෂිත තත්ත්වයන් සහ අවදානම් සහගත තත්ත්වයන්** හඳුනා ගැනීම සඳහා සංඛ්‍යානමය විශ්ලේෂණ වැඩි කිරීම සහ (3) **මූල්‍ය ස්ථායීතාව** පවත්වා ගෙන යෑම සඳහා **පූර්ව සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති** ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස මූල්‍ය පද්ධතියට **සිදු විය හැකි පද්ධතිමය අවදානම්** හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට දායක කර ගැනීම සඳහා **ආතති පරීක්ෂා සහ මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශක** ප්‍රධාන වශයෙන් භාවිතා කරමින් **අවදානම් කල්තියා හඳුනා ගැනීමේ රාමුව** වැඩිදියුණු කිරීම යනාදිය මෙම වැඩිදියුණු වූ ආයතනිකමය රාමුවලට ඇතුළත්ය.

මහ බැංකුව රටෙහි පවත්නා **ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම්** ශක්තිමත් කිරීමට සහ ඉහළ යන ගෙවීම් අවශ්‍යතාවලට පහසුකම් සැලසිය හැකි ආකාරයෙන් කාර්යක්ෂම සහ ස්ථායී ගෙවීම් සහ පියවීම් පද්ධතියක් ඇති කිරීමට අඛණ්ඩව පියවර ගෙන ඇත.

මෙම වැදගත් කර්තව්‍යය අඛණ්ඩව සිදු කරමින් **අඩු මුදල් භාවිතයක් සහිත සමාජයක්** රට තුළ ස්ථාපිත කිරීම සඳහා **විද්‍යුත් මාර්ගයෙන් සිදු කරන ගෙවීම්** ප්‍රවර්ධනය කිරීමට **ජාතික ගෙවීම් පද්ධතිය** වැඩිදියුණු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මේ සම්බන්ධයෙන්, රජයේ ගෙවීම් සිදු කිරීම සඳහා බලපාන පොදු ගෙවීම් ක්‍රමයක් (platform) සකස් කරමින් පවතී. විශේෂයෙන්ම, **තත්කාලීන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS)** හරහා ශ්‍රී ලංකා රේගුවේ ගෙවීම් සිදු කිරීම ඊට අදාළ වේ. වර්තමානයේ පවත්නා ජාත්‍යන්තර කාඩ්පත් යෝජනා ක්‍රමයට පිරිවැය එලදායී විකල්පයක් ලෙස **ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමයක්** සහ ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ගෙවීම් කාඩ්පත්හි නිශ්කාෂණය සහ යොමු කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා **විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර ආශ්‍රිත පොදු යාන්ත්‍රණයක් (CPS)** හඳුන්වා දෙමින් සිටී. ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් අරමුදල් ගිණුම් හා ඒවායේ අන්තර් ක්‍රියාකාරිත්වය අතර වෙනස සහතික කිරීම සඳහා **ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයක් (CMobs)** ද ක්‍රියාත්මක කිරීමට නියමිතය. තවද, විද්‍යුත් සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවල කාර්යක්ෂමතාවය වැඩි කිරීම සහ එවැනි ගෙවීම් පද්ධති ආශ්‍රිතව ඇති විය හැකි අවදානම් අවම කිරීමේ අදහසින් **විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය, විකුණුම්පල ගෙවීම් ආශ්‍රිත පොදු යාන්ත්‍රණය සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයක්** එක්ව ලියාපදිංචි

බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල **ප්‍රගතිය අධ්‍යයනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම** සිදු කරනු ඇත.

ඉන් ඉදිරියට යමින්, **ලියාපදිංචි ගෙවීම් කාඩ්පත් සේවා සපයන්නන්** සහ **ජංගම ගෙවීම් පද්ධති**, ඒවාට අදාළ නියාමන හා මාර්ගෝපදේශ සමඟ පවත්වා ගත යුතු අනුකූලතාව සහතික කිරීම පිණිස ඒවායේ අධීක්ෂණ රාමුව සහ සිදු කරන දුරස්ථ පරීක්ෂණ හා එතැන් පරීක්ෂණ ශක්තිමත් කිරීමට නියමිතය. මීට අමතරව, අන්තර්ජාල ගෙවීම්වල සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා **අන්තර්ජාල බැංකු ආශ්‍රිත මාර්ගෝපදේශ සහ ආරක්ෂණ ප්‍රමිති** හඳුන්වා දීමට ද අපි අදහස් කරන්නෙමු.

2016 වසරේ දී, **මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදය සඳහා අරමුදල් ගලායෑම වැළැක්වීම පිළිබඳ වූ** අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් **ජාතික ප්‍රතිපත්තිය** මහ බැංකුව විසින් ක්‍රියාවට නංවනු ලැබීය. වර්තමානයේ දී, සියලුම පාර්ශ්වකරුවන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදය සඳහා අරමුදල් ගලායෑම වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියට සහාය දැක්වීමට අභ්‍යන්තර සැලසුම් වැඩිදියුණු කරමින් සිටී.

රටේ ශ්‍රේණිගත කිරීම උසස් කිරීම පිණිස **මූල්‍ය කටයුතු පිළිබඳ කාර්යසාධන බලකායේ** නිර්දේශ ඵලදායීව ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් ගලා යෑම වැළැක්වීම ශක්තිමත් කළ යුතුව ඇත. අපේක්ෂිත මට්ටමට අනුකූල වීමට ශ්‍රී ලංකාව අපොහොසත් වුවහොත් අප රට ඉහළ අවදානම් සහිත රටක් ලෙස සලකනු ලැබීමට ඉඩ ඇත. එය මූල්‍ය අංශය කෙරෙහි අහිතකර ප්‍රතිවිපාකයන් ඇති කිරීමට හේතු වේ.

මෙම අභියෝග මැඩපැවැත්වීමට සහ අදාළ අනුකූල වීම් සහතික කිරීමට උපායමාර්ගික ක්‍රියාමාර්ග ගණනාවක් මැදි කාලීනව ගැනීමට මහ බැංකුව ඉලක්ක කරයි.

**ක්ෂුද්‍ර මූල්‍ය පනත**, 2016 ජූලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කළ බව මම ප්‍රකාශ කර සිටින්නට කැමැත්තෙමි. මීට අනුකූලව, **2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනතට** අනුව ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල වගකීම් ඉටුකිරීමට සහ ඒවායේ මනා යහපාලනය, විනිවිද බව සහ ස්ථායිතාව තහවුරු කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිණිස **ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව** නමින් වෙනම දෙපාර්තමේන්තුවක් මහ බැංකුව විසින් ස්ථාපනය කරන ලදී.

මීට අදාළව, මහ බැංකුව යෝග්‍ය ආයතනවලින් අයදුම්පත් භාර ගැනීමට සූදානම්ව සිටින අතර, ඒවා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන්හි ආවේක්ෂණ සහ එතැන් පරීක්ෂණ මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු

කරනු ඇත. එමෙන්ම, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමඟ අඛණ්ඩ කතිකාවක් පවත්වා ගෙන යෑමට සහ අදාල රෙගුලාසි සම්බන්ධව දැනුම්වත් කිරීම් වැඩිදියුණු කිරීම ද අපගේ අපේක්ෂාවයි.

ආර්ථිකයේ ප්‍රමුඛ මූල්‍ය ආයතනය වශයෙන් මහ බැංකුව, මූල්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති සහ සැලසුම් යෝජනා කරන අතරම අප ආයතනයේ ස්ථායී බව, අඛණ්ඩ පැවැත්ම මෙන්ම සුරක්ෂිතතාවය සහතික කිරීමට ද අපට අවශ්‍යව ඇත. මහ බැංකු විශේෂයෙන්ම මහජන වත්කම්වල භාරකරු වශයෙන් සලකන බැවින්, **ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පැවතිය හැකි අවදානම් පිළිබඳව මනා අවධානයකින් කටයුතු කරන පරිසරයක්** ඇති කිරීම වැදගත් වේ.

ඒ අනුව, මහ බැංකුව **"තෙවැදෑරුම් ආරක්ෂක ක්‍රමයක්" සහිත අවදානම් කළමනාකරණ රාමුවක්** අඛණ්ඩව අනුගමනය කිරීමට අදහස් කරයි. මෙහි පළමු පෙළ ආරක්ෂක ක්‍රමය ලෙස මෙහෙයුම් කළමනාකරුවන් ද, පිළිවෙළින් දෙවන පෙළ සහ තෙවන පෙළ ආරක්ෂක ක්‍රමයන් ලෙස පිළිවෙළින් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ද කටයුතු කරනු ලබයි.

තවද, ප්‍රතිලාභ අරමුණු හා අවදානම තුලනය කරන යහපාලන සහ අවදානම් කළමනාකරණ රාමුවක් සමඟ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය සහ පාලනය ඇති කිරීමේ අදහසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු සඳහා **උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමයක් (Strategic Asset Allocation)** වැඩිදියුණු කර ඇති අතර, ඊට අනුගත වන ආකාරයෙන් **නව ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයක්** ද සකස් කර ඇත. එසේම, සංශෝධිත ආයෝජන නිර්ණායක පිළිබිඹු වන ආකාරයෙන් **ආයෝජන මාර්ගෝපදේශ** සමාලෝචනය කර ඇත.

මහ බැංකුව සඳහා **අවදානම් හඳුනා ගැනීමේ රාමුවක්** සංවර්ධනය කිරීම පිණිස සියලුම දෙපාර්තමේන්තුවල **අවදානම් හඳුනා ගැනීමේ** නියැලෙමින් මූල්‍ය හා මූල්‍ය නොවන **අවදානම් අධ්‍යයනය කිරීමට පාලන ආකෘතියක්** ඇති කිරීම සහ පද්ධති හා ක්‍රියාපටිපාටි දියුණු කිරීම මෙම ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවට ඇතුළත්ය.

# 5. ආර්ථිකය සවිමත් කිරීම සඳහා වන පුළුල් ප්‍රතිපත්ති

## ව්‍යවහාර මුදල් කළමනාකරණය:

මහජනතාවගේ අවශ්‍යතා අනුව ව්‍යවහාර මුදල් සඳහා පවත්නා ඉල්ලුමෙහි කිසිදු හිඟයක් නොමැතිව මහජනතාවට අවශ්‍ය රුපියල් නෝට්ටු සහ කාසි ලබා ගැනීමට ඇති හැකියාව සහතික කිරීමට අපට අවශ්‍යය. **දීප ව්‍යාප්තව කාසි මුදා හැරීම සඳහා නව යාන්ත්‍රණයක් වැඩිදියුණු කිරීමටත්,** බැංකු සමඟ ඒකාබද්ධව කාසි එකතු කිරීම සඳහා මහජනතාවට ලබා දී ඇති කාසි කැට නැවත එකතු කිරීමටත් අපේක්ෂිතය.

2017 වසරේ දී කාසි ටංකනය කිරීමට වැය වන පිරිවැය අඩු කිරීම සඳහා **නව කාසි එකතුවක් නිකුත් කිරීමට** මහ බැංකුව සැලසුම් කොට ඇත. ඊට අමතරව, මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් නෝට්ටුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ද ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

අතීතයේ දී මෙන්ම මහ බැංකුවේ **ව්‍යවහාර මුදල් කළමනාකරණ ප්‍රතිපත්තිය** ගුණාත්මක ප්‍රමිතීන්ගෙන් යුක්තව පවත්වා ගෙන යෑම කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත. ඒ අනුව, නැගී එන ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රතිරූපය නිරූපණය වන ආකාරයෙන් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල ගුණාත්මක බව වර්ධනය කිරීම පිණිස ව්‍යවහාර මුදල් නෝට්ටුවල විකෘති කිරීම්, වෙනස් කිරීම් සහ මකා දැමීම් සිදු කරන පාර්ශ්ව සඳහා මුදල් නීති පනතට අනුව **නීති දැඩිව ක්‍රියාත්මක කිරීමට** මහ බැංකුව සැලසුම් කර ඇත.

## සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය:

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල සතු වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 1.8 කි. පසුගිය වසර තුළ දී අරමුදලේ සංවිධානමය කාර්යසාධනය ඉහළ නැංවීමට සහ සමස්ත අවදානම් කළමනාකරණ රාමුව වැඩිදියුණු කිරීමට අප විසින් ප්‍රතිපත්ති පියවර රැසක් හඳුන්වා දී ඇත. ඊට අමතරව, **ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ** පළමු කොටස සම්පූර්ණ කිරීම සහ ඇතැම් **කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම** අරමුදලේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට හේතු වනු ඇත. ඉදිරියේ දී, **මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල** ස්ථාපිත කර ඇති සේවක අර්ථසාධක අරමුදලෙහි ඒකක මාර්ගයෙන් සේවක අර්ථසාධක අරමුදලෙහි මෙහෙයුම් කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් ඇතිව **අරමුදලෙහි සියලුම සාමාජිකයන් නව ජාතික හැඳුනුම්පත ද සහිතව නැවත ලියාපදිංචි කිරීමට** අවශ්‍ය පියවර ගෙන ඇත.

රජයේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයට අනුගතව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි **ආයෝජන ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක** අපි නිරත වී සිටිමු. එහිදී, ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ද සහිතව යෝග්‍ය ආකාරයෙන් වත්කම් විවිධාංගීකරණය කිරීම සහ අවදානම් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබයි.

ඉදිරි වසරවල දී සේවක අර්ථසාධක අරමුදල පහත සඳහන් කරුණු පිළිබඳව ද අවධානය යොමු කරනු ඇත;

- සේවායෝජකයන්, සේවාදායකයන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීම සඳහා **ජාල මත පදනම් වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැඩිදියුණු කිරීම**
- පවත්නා තොරතුරු පද්ධතියෙහි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම
- මුදල් ආපසු ගෙවීමේ පද්ධතියෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම
- සේවා සැපයුම් මට්ටම වැඩිදියුණු කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදලෙහි මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ වන පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත් බව ඉහළ නැංවීම
- සේවායෝජකයන් හා සේවාදායකයන් යන දෙපාර්ශ්වය සඳහාම **විද්‍යුත් ගිණුම් ස්ථාපිත කිරීම**
- **වෙබ් අඩවි පාදක කරගත් (Web based) දත්ත** රැස් කිරීම සහ දායක මුදල් ගෙවීමේ පද්ධතියක් හඳුන්වා දීම. මෙමගින් අරමුදලෙහි සේවායෝජකයන්ට සාමාජික ගිණුම්වල සත්‍ය වලංගු කාලය පිළිබඳ දැනුම්වත් වීමට අවස්ථාව ලැබේ.
- ආයෝජන සඳහා **නව වෙළඳපොළවල් සහ නව වත්කම් කාණ්ඩ හඳුනා ගැනීම** සහ අවදානම් ගලපනු ලැබූ ඉහළ ප්‍රතිලාභ ජනනය සඳහා යෝග්‍ය පරිදි වත්කම් වෙන් කිරීම් පවත්වාගෙන යෑම
- කාර්යක්ෂම සහ ඵලදායී ලෙස අරමුදල කළමනාකරණය කිරීම සඳහා **ආයතනික හැකියාව ඉහළ නැංවීම**
- **මූල්‍ය අවදානම් කළමනාකරණය** සඳහා වන රාමුව වැඩිදියුණු කිරීම

රාජ්‍ය ණය කළමනාකරණය: ඔබ දන්නා පරිදි මහ බැංකුව විසින් රජය වෙනුවෙන් රාජ්‍ය ණය කළමනාකරණය සිදු කරනු ලබයි. මෙම වගකීම ඉටු කිරීමේ දී අපගේ ණය කළමනාකරණ කටයුතු ඉතා ඉහළ වෘත්තීය මට්ටමකින් සහ අවංකභාවයකින් යුතුව සිදු කරනු ලබන බවට වගබලා ගැනීමට අපට අවශ්‍යය.

මේ තත්ත්වය තුළ මුදල් මණ්ඩලය විසින් ණය වෙළඳපොළ සහ ණය කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දී ඇත. ඒ අතරින් ඇතැම් ක්‍රියාමාර්ග දැනටමත් ක්‍රියාවට නංවා ඇත.

2016 ජූලි මාසයේ දී අප විසින් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත වෙන්දේසියට අදාළ තොරතුරු පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ **පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම්** පැවැත්වීම නැවත හඳුන්වා දෙන ලදී. මෙලෙස වෙළඳපොළ තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම තුළින් විනිවිද භාවය ඉහළ නැංවීම අපගේ බලාපොරොත්තුවයි.

වෙන්දේසි සම්බන්ධයෙන් බොහෝ තොරතුරු සහිත **වාර්ෂික දින දර්ශනයක්** මුදල් අමාත්‍යාංශයේ ද සහයෝගය ඇතිව ප්‍රකාශයට පත් කිරීමට අප කටයුතු කරමින් සිටින අතර, එය කාර්තුමය වශයෙන් සමාලෝචනය කරනු ඇත. රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි **ප්‍රාථමික වෙන්දේසි ක්‍රියාවලියේ** විනිවිදභාවය සහ පුරෝකථනය කිරීමේ හැකියාව ඉහළ නැංවීමට මෙය හේතු වනු ඇත. මෙමගින් සියලු වෙළඳපොළ සහභාගිවන්නන්ට තොරතුරු සඳහා සමාන ප්‍රවේශයක් හිමිවන අතර, සිදු වීමට නියමිත ගනුදෙනු ආශ්‍රිත තොරතුරු කලින්ම ලබා ගැනීමට ඇති හැකියාව ද එමගින් තහවුරු කෙරෙනු ඇත.

තවද, අපගේ මෙහෙයුම් කටයුතුවල විනිවිදභාවය වැඩි කිරීමේ අභිප්‍රායෙන් 2016 ජූනි මාසයේ සිට, මහ බැංකුව විසින් වෙන්දේසියකදී **පිරිනමනු ලබන සමස්ත අරමුදල් ප්‍රමාණයට වඩා වැඩි අරමුදල් ප්‍රමාණයක් භාර නොගැනීමට** තීරණයක් ගෙන ඇත. කෙසේ වෙතත්, පිරිනමන ලද ප්‍රමාණයට වඩා අඩු අගයක් පිළිගන්නා අවස්ථා තිබිය හැකිය.

රජයේ සුරැකුම්පත් වෙළඳාම සඳහා **බ්ලූම්බර්ග් ගනුදෙනු පද්ධතියක් ද** (Bloomberg Trading Platform) හඳුන්වා දී ඇත. පුළුල් මිල ගවේෂණයකට ඇති හැකියාව, විනිවිදභාවය සහ ඉහළ විශ්වසනීයත්වය ද්විතීයික වෙළඳපොළෙහි වෙළඳාම් කිරීමේ ධාරිතාවය කැපීපෙනෙන ලෙස ඉහළ යෑමට හේතු වී ඇත.

තවද, **බ්ලූම්බර්ග් විද්‍යුත් වෙළඳාම් පද්ධතිය** ප්‍රතිමිලදී ගැණුම් ගනුදෙනු සඳහා ව්‍යාප්ත කිරීමටත්, **ද්විපාර්ශ්වීය මිල ගණන් (Two-Way Quotes)** අනිවාර්ය කිරීමටත් අපේක්ෂිතය. මෙය, මිල යාන්ත්‍රණයට වෙළඳපොළ මාර්ගෝපදේශයන් ලබා දීමේ හැකියාව වැඩිදියුණු කරනු ලබන අතර, මිල පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමෙන් සහ විනිවිදභාවය තුළින් සුරැකුම්පත් වෙළඳපොළේ ද්‍රවශීලතාවය ඉහළ යෑමට හේතු වනු ඇත.

රජයේ සුරැකුම්පත් සඳහා වන **ප්‍රාථමික වෙන්දේසිවලට අදාළ නීති** ප්‍රකාශයට පත්

කිරීම තුළින් අදාළ ක්‍රියාපටිපාටියෙහි විනිවිදභාවය සහ ප්‍රමිතිය ඉහළ නැංවීමට ද අපේක්ෂිතය.

මේ අතර, **වර්තමාන වෙන්දේසි ක්‍රියාවලිය** සමාලෝචනය කරමින් සිටින අතර, එම ක්‍රියාවලියට අදාළ **නව කෙටුම්පත** ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත දැනටමත් ලබා දී තිබේ. **කෙටුම්පත් කරන ලද මෙම වෙන්දේසි පද්ධතිය** ක්‍රියාත්මක කිරීමට පෙර මෙම ජාත්‍යන්තර සංවිධාන මගින් එහි වලංගුභාවය තහවුරු කර ගැනීමට මහ බැංකුව අපේක්ෂා කරයි. 2017 වසරේ මුල් කාර්තුවේ දී එය සිදු කිරීමට අපේක්ෂා කෙරේ. වෙන්දේසි ක්‍රියාවලිය, මුදල් ප්‍රවාහ කළමනාකරණය සහ ණය කළමනාකරණ උපායමාර්ග ඇතුළු අංශ කීපයක් පිළිබඳව සලකා බැලීමටත් රජයේ සුරැකුම්පත් සඳහා යෝග්‍ය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමටත් අප විසින් ඇමෙරිකා එක්සත් ජනපද භාණ්ඩාගාරයේ උපදේශකවරයෙකුගේ සේවය ලබාගෙන තිබේ.

අදාළ නීතිවලට වෙනස්කම් හඳුන්වා දීම තුළින් **ණය කළමනාකරණ ක්‍රියාවලිය** වැඩිදියුණු කිරීම සඳහා, වගකීම් කළමනාකරණ ක්‍රියාමාර්ගවල ද කොටසක් වන ප්‍රතිමිලදී ගැනුම්, ඉදිරි හුවමාරු (SWAP) ගිවිසුම් වැනි ක්‍රියාකාරී ණය කළමනාකරණ ක්‍රියාමාර්ග යොදා ගැනීමට ඇති හැකියාව සොයා බැලීමට අපේක්ෂිතය.

රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළඳපොළ ගැඹුරු හා පුළුල් කිරීම සඳහා අවශ්‍ය වන නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් රජයේ සුරැකුම්පත් සඳහා **මධ්‍යම ප්‍රතිපාර්ශ්වීය පද්ධතිය** සහ **විද්‍යුත් වෙළඳ පද්ධතියක්** පිහිටුවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කරනු ඇත. ඊට සමානවම, යෝජිත විද්‍යුත් වෙළඳ පද්ධතිය සහ **නිෂ්කාශන පද්ධතිය** හරහා ද්විතීයික වෙළඳපොළ ණය උපකරණ හා සම්බන්ධ ද්විතීයික වෙළඳපොළ තොරතුරු සැපයීමට යාන්ත්‍රණයක් ද පිහිටුවීමට කටයුතු යොදා ඇත. එමනිසා, නුදුරේදීම අපට ද්විතීයික වෙළඳපොළ තුළ සිදුවන රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද **නව මෙහෙයුම් ක්‍රියාවලි සමුදායකට** හිමිකම් කීමට හැකි වනු ඇත.

එක්සත් ජනපද ඩොලර්වලින් මෙන්ම ශ්‍රී ලංකා රුපියල්වලින් ද නිකුත් කරන ණය උපකරණවල **වගකීම් කළමනාකරණය** සඳහා ක්‍රියාවලියක් සැකසීමේ හැකියාව පිළිබඳව මහා භාණ්ඩාගාරය දැනටමත් අධ්‍යයනය කරමින් සිටී. මෙම ක්‍රියාවලිය සම්බන්ධව මහ බැංකුව භාණ්ඩාගාරය සමඟ සමීපව කටයුතු කරනු ඇත.

සීමිත සම්පත් හේතුවෙන් දේශීය වෙළඳපොළට ඇති වන අවිනිශ්චිත පීඩනවලින් ආරක්ෂා කර ගැනීම සඳහා සහ ආරක්ෂණයක් ලෙස **ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ** හිතකර ආකාරයෙන් පවතින අවස්ථාවලදී ඒ සඳහා ප්‍රවේශ වීම ද අප විසින්

කළ යුතුය. මෙය **විදේශ ආයෝජක පදනම** පුළුල් හා විවිධාංගීකරණය සඳහා ද බලපානු ඇත. ඇතැම් මහා පරිමාණ විදේශ ආයෝජකයන් අතර විනිමය පිළිබඳ වර්ධනය වන විශ්වසනීයත්වයක් පවතින බව අප නිරීක්ෂණය කර ඇති අතර, අනාගතයේ දී අපට ජාත්‍යන්තර බැඳුම්කර රුපියල්වලින් නිකුත් කිරීමටත් එමගින් විනිමය අනුපාත විචලනයන්ට පවතින පීඩනය අවම කිරීමටත් හැකියාවක් පවතී. ඉදිරියේ දී බැඳුම්කර වෙළඳාම **යූරෝ ක්ලියර් පද්ධතිය** හරහා සිදු කිරීමට පහසුකම් සලසා ගැනීම පිණිස එම පද්ධතිය සමඟ සම්බන්ධ වීමට කටයුතු කරමින් සිටිමු. එවැනි ක්‍රියාදාමයක් ආයෝජකයන්ට ගනුදෙනු පියවීමේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීමට මෙන්ම දේශීය සුරැකුම්පත් වෙළඳපොළ ආයෝජන සඳහා පවතින ඉතුරුම් ප්‍රමාණය ඉහළ යෑමට ද ඉවහල් වේ.

නව **රාජ්‍ය ණය පනතක්** ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිතය. ණය කළමනාකරණය හා සම්බන්ධ සියලු කටයුතු වෘත්තීයවේදීන් කණ්ඩායමක් විසින් ඒකාබද්ධ කිරීමට කටයුතු කරමින් සිටී. මුදල් අමාත්‍යාංශය තුළ වෙනම **ණය කළමනාකරණ ඒකකයක්** ස්ථාපිත කිරීම ද සිදු කෙරෙමින් පවතී.

අවුරුදු ගණනාවක සිට මේ දක්වාම මහ බැංකුව, ස්වාධීන මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සහ අඩු වියදමකින් රජයට අරමුදල් සම්පාදනය කිරීම යන කරුණු අතර ගැටීමක් පවතින නිසා අපගේ අදහසට අනුව මෙය ඉදිරි පියවරක් ලෙස සැලකිය හැකිය. මෙම එකිනෙක ගැටෙන අරමුණු නිසා **මහ බැංකුවට තම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් අභියෝගවලට මුහුණ දීමට සිදු වේ.** එමනිසා, ණය කළමනාකරණ කාර්යය මහ බැංකු කටයුතුවලින් ඉවත් කිරීම තුළින් **ස්වාධීන මුදල් ප්‍රතිපත්තියක්** ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් අවකාශයක් ලැබෙනු ඇත.

විදේශ විනිමය කළමනාකරණය: විදේශ විනිමය ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීමේ අරමුණින් යුතුව මහ බැංකුව මෑත කාලයේ දී රජයේ සහයෝගය ඇතිව නව ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. ගෝලීය ව්‍යාපාර කටයුතුවල තරගකාරීත්වය වර්ධනය කිරීම තුළින් ආයෝජන විශ්වාසය ගොඩනැංවීමත්, විදේශීය සංචිත ශක්තිමත් කිරීමට සහ විදේශ විනිමය වෙළඳපොළ ස්ථාවර කිරීමත් අරමුණු කරගත් ප්‍රතිපත්තියට අනුගත වන පරිදි වත්මන් විදේශ විනිමය කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් වී ඇති බව අවධාරණය කළ යුතුය.

නව **විදේශ විනිමය පනතක්** හඳුන්වා දීමේ කාලීන අවශ්‍යතාවය රජය විසින් හඳුනා ගෙන ඇත. 2017 අයවැය තුළින් යෝජනා කළ පරිදි නව විදේශ විනිමය කෙටුම්පත 2017 වසර තුළ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත.

මීට අමතරව, **තවදුරටත් විදේශ විනිමය ගනුදෙනු ලිහිල් කිරීමට** අප විසින් කටයුතු කරනු ඇත.

ප්‍රාදේශීය සංවර්ධනය: ජීවන තත්ත්වය ඉහළ නැංවීම, මූල්‍ය සාක්ෂරතාවය හා මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීම සහ සමබර ප්‍රාදේශීය වර්ධනයක් හා තුලිත සංවර්ධනයක් තහවුරු කිරීමේ අරමුණින් යුතුව රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව සහභාගිත්ව මූල්‍ය ආයතන හා එක්ව සහනදායී සංවර්ධන ණය යෝජනා ක්‍රම ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි.

- *ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (MSMEs) සඳහා නව ණය යෝජනා ක්‍රමයක්:* ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව **ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය** සඳහා සහ සේවා නියුක්ති අවස්ථා උත්පාදනය සඳහා මෙම ණය ක්‍රමය සැලසුම් කර ඇත. එය රජයේ අනුග්‍රහය ඇතිව තරුණ පිරිස් සහ තරුණ උපාධිධාරීන්, කාන්තාවන් සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ගේ මූල්‍ය, තාක්ෂණික, වෙළඳ ව්‍යවසායකත්ව අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් වූ ණය යෝජනා ක්‍රමයකි. මෙම යෝජනා ක්‍රමයේ විශේෂ ලක්ෂණය වනුයේ ආරම්භක ව්‍යාපාරයන්හි මූලික වියදම් දැරීම සඳහා විශේෂ ප්‍රදානයක් ලබාදීමයි. මෙම ප්‍රදානය රුපියල් 50,000 ක උපරිමයකට යටත් වන අතර, වර්ෂයකට සියයට 5.5 ක පොලී අනුපාතයක් යටතේ රුපියල් 250,000 ක උපරිම ණය මුදලක් ලබා දෙනු ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් බිලියන 4.0 ක් ආර්ථිකයේ අවශ්‍ය කොටස් වෙත ලබාදීමට අපේක්ෂා කරන අතර, 2017 ජනවාරි මස සිට එය ආරම්භ කෙරෙනු ඇත.

- *මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ජාතික ක්‍රමෝපායක් සැකසීම:* මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණයේ (Financial Inclusion Survey) සොයාගැනීම්වලට අනුව, **මූල්‍ය අන්තර්ග්‍රහණය සඳහා වූ ජාතික ප්‍රතිපත්තියට** අදාළ පුළුල් කෙටුම්පතක් ශ්‍රී ලංකාව හා සමාන රටවල්වල මූල්‍ය අන්තර්ග්‍රහණය සඳහා භාවිතා කළ උපායමාර්ග ද සලකා බලමින් සකස් කෙරෙනු ඇත. යෝජිත ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත සැකසීමේ දී අඛණ්ඩ සංවාද හරහා දේශීය පාර්ශ්වකරුවන්ගේ අදහස් ද ලබා ගැනීමට නියමිතය.

- *වාණිජ මට්ටමේ කාබනික කෘෂිකර්මාන්තය සහ කිරි ආශ්‍රිත ව්‍යවසායකත්ව සංවර්ධනය:* කාබනික කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් ඇති බහුවිධ ප්‍රතිලාභ හේතුවෙන් සහ ඒ සඳහා මහජනතාවගේ සහ රජයේ පවතින අවධානය ඉහළ යෑම නිසා විධිමත් **කෘෂි**

**ව්‍යාපාර සමිති** සහ **බහුවිධ පාර්ශ්වකරුවන්ගෙන් යුත් ව්‍යවසායයන්** නිර්මාණය කිරීම තුළින් වාණිජ මට්ටමේ කාබනික කෘෂිකර්මාන්තය සහ කිරි ආශ්‍රිත කර්මාන්ත වර්ධනය කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

- *සූර්ය බලය උත්පාදනය වර්ධනය සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම:* ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහිතව සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ද සහාය ඇතිව රටෙහි **සූර්ය බලය උත්පාදනය ප්‍රවර්ධනය** සඳහා මෙය ක්‍රියාත්මක කරනු ලැබේ.
- *හරිත මූල්‍යනය සංවර්ධනය:* මීට අමතරව, පරිසරය ආරක්ෂා කිරීමට ව්‍යවසායකත්ව ආයතන ධෛර්යමත් කිරීම, සම්පත් ආරක්ෂා කිරීම සහ මධ්‍යස්ථ ලෙස කාබන් භාවිතා කිරීම පිළිබඳව දැනුම්වත් කිරීම් වැඩිදියුණු කිරීම හරහා **හරිත මූල්‍යනය** ප්‍රවර්ධනය කිරීමට මහ බැංකුව කටයුතු කරනු ඇත. පරිසරය ආරක්ෂා කිරීමේ අරමුණෙන් හරිත ව්‍යාපාරයන්ට මූල්‍ය පහසුකම් සැපයීමට බැංකු ධෛර්යමත් කිරීමට ද මහ බැංකුව කටයුතු කරනු ඇත.

හරිත මූල්‍යනය සංවර්ධනය සඳහා ජාත්‍යන්තරය තුළ පවතින උද්යෝගය හා සමගාමීව මහ බැංකුව ද නැගී එන වෙළඳපොළවල මූල්‍ය නියාමන ආයතන හා බැංකු සමාගම් හරහා තිරසාර මූල්‍ය ක්‍රමයක් ඇති කිරීමට දැනුම හා ශක්‍යතා වර්ධනය වෙනුවෙන් පහසුකම් සලසන ආයතනයක් වන **ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) තිරසාර බැංකු ජාලය (SBN)** හා එක්වී තිබේ. තිරසාර බැංකු ජාලයේ සාමාජිකයෙකු ලෙස දේශගුණික වශයෙන් හිතකර, සමාජීය ලෙස අන්තර්ග්‍රහණය වූ හරිත ව්‍යාපාර සඳහා සහාය වීමට සහ මූල්‍යනය කරනු ලබන ව්‍යාපාරවල පාරිසරික හා සමාජීය අවදානම් මනාව කළමනාකරණයට සහාය වීම සඳහා තිරසාර බැංකු භාවිතයන් කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු. තිරසාර මූල්‍යකරණයේ වැදගත් පියවරක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට වැඩමුළුවක් 2017 වසරේ පළමු කාර්තුවේ දී පැවැත්වීමට අපේක්ෂිතය.

# 6. සමාප්ති සටහන

නෝනාවරුනි මහත්වරුනි,

මෙම පෙරදැක්ම තුළින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති හා ඉදිරි දැක්ම ඔබගේ ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීමේ දී හා ඉදිරි කාලයේ අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමේ දී බෙහෙවින් ඉවහල් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. එමෙන්ම, ආර්ථිකයේ අවශ්‍යතා මත පදනම්ව හා අනපේක්ෂිත තත්ත්වයන්වලදී නව ප්‍රතිපත්ති හා සැලසුම් හඳුන්වා දීමට අප පසුබට නොවන බව සඳහන් කිරීමට මම කැමත්තෙමි. එවැනි අවස්ථාවන්හි අවශ්‍ය උපදෙස්වලට අනුගතව ක්‍රියාත්මක කරනු ලබන උපායමාර්ග අදාළ පාර්ශ්වකරුවන්ට පැහැදිලිව සන්නිවේදනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

මේ මොහොතේ දී වැදගත් කරුණු කිහිපයක් අවධාරණය කරමින් මෙම ප්‍රකාශය අවසන් කිරීමට මා කැමතියි.

සාර්ව ආර්ථික මූලධර්ම වැඩිදියුණු වීම තුළින් පෙන්නුම් කරන පරිදි ආර්ථිකයේ ස්ථායීතාව පුළුල්ව බලන කල යහපත් මට්ටමක පවතින බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ මුදල් බලධාරියා සහ මූල්‍ය පද්ධතියේ නියාමකයා ලෙස **ස්ථායී ආර්ථික තත්ත්වයන් තිරසාර අයුරින් සහතික කිරීම සඳහා අපගේ සියලු ප්‍රයත්න දරන්නෙමු.**

මෙම ප්‍රතිපත්තිවලින් සමහරක් කෙටි කාලීනව පීඩාකාරී යැයි දැනුන ද මැදි කාලීනව **ආර්ථිකයේ ස්ථායීතාව** ශක්තිමත් කිරීමට උපකාරී වේ. මෙය සියලු ශ්‍රී ලාංකිකයන්ට දිගු කාලීන වශයෙන් සෞභාග්‍යය ළඟා කරවීම සඳහා ඉතා වැදගත් වේ.

ආර්ථික ස්ථායීතාව පවත්වා ගෙන යෑමේ නියෝජිත ආයතනය වශයෙන් මහ බැංකුව **විසින් රටේ සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාව තහවුරු කිරීම සඳහා පැහැදිලි සහ ස්ථිර ප්‍රතිපත්ති** හරහා සිය කාර්යභාරය අඛණ්ඩව ඉටු කරනු ඇත. වැඩිදියුණු කෙරෙමින් පවතින සාර්ව ආර්ථික රාමුව මගින් මෙම අරමුණු ළඟාකර ගැනීම සඳහා සහයෝගය ලබා දෙනු ඇත.

රටේ ආර්ථික ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මූලික වශයෙන් පහසුකම් සපයන්නෙකුගේ කාර්යභාරය ඉටු කිරීම අපගේ වගකීම වේ. ආර්ථික ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස අපි පෞද්ගලික අංශය ප්‍රධාන කොටගත් රජයේ නව වර්ධන ආකෘතිය සඳහා අඛණ්ඩව සහාය ලබා දෙන්නෙමු.

අපගේ ප්‍රතිපත්ති තුළින් දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනයට සහ අපනයන ඉහළ නැංවීමට **රජයේ සමස්ත ප්‍රයත්නයට** සහාය දැක්වීම අරමුණු කෙරේ. මේ සඳහා ආයෝජන

හා වෙළඳාම අතර සබැඳියාවේ ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා අවස්ථාව නිර්මාණය කිරීමට මග සලසමින්, ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමට සහ වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැපයීමට වන ප්‍රයත්නයන් හරහා රටේ ආර්ථික වර්ධනයට අපගේ දායකත්වය ලබා දෙනු ඇත.

මෙම තත්ත්වය තුළ **ශ්‍රී ලංකාවේ දැකිය හැකි සැලකිය යුතු ආර්ථික විභවතාව වැඩිදියුණු කිරීම,** විශේෂයෙන්ම ඉදිරි වසර හෝ වසර දෙක තුළ දී දේශීය පෞද්ගලික අංශය තුළින් සිදු විය යුතු බවට මම විශ්වාස කරමි. **මහා නගර සංවර්ධන ව්‍යාපෘතිය** මෙන්ම **හම්බන්තොට, ත්‍රිකුණාමලය හා මහනුවර සංවර්ධනය කිරීමට රජය විසින් සකස් කර ඇති ප්‍රධාන සැලසුම්** සහ විවිධ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් තුළින් **දේශීය සහ විදේශීය ආයෝජකයින් සඳහා පුළුල් ආයෝජන අවස්ථා විවෘත වනු ඇත.**

සමස්තයක් වශයෙන් ගත් කල සංවර්ධනය සඳහා වූ ඉදිරි ගමන නිසි මගට යොමුව තිබුණ ද රටෙහි සමස්ත දුගී බව දුරුකිරීමෙහි ලා වූ ක්‍රියාවලියේ දී මේ වනවිට යම්තාක් දුරකට සාර්ථකත්වයක් අත්කර ගෙන ඇතත් පළාත් හා දිස්ත්‍රික්ක අතර දුගී බවෙහි විෂමතාවයක් තවමත් පවතින බව අප විසින් සිහි තබාගත යුතුය. මේ පිළිබඳව අවධානය යොමු කිරීමේ කඩිනම් අවශ්‍යතාවය හඳුනා ගෙන රජය විසින් **තිරසාර සංවර්ධන ඉලක්ක** (SDGs) හා අනුගතව ශ්‍රී ලංකාවේ දුගී බව සියලු ආකාරයන්ගෙන් පිටුදැකීම සඳහා 2017 වසර **"දිළිඳුකම පිටුදැකීමේ වසර"** ලෙස ප්‍රකාශයට පත් කොට ඇත.

මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීමෙහිලා මූලික වන **සාධාරණ හා ආර්ථික වර්ධනයට සැමට සහභාගී වීමටත් ඉන් ප්‍රතිලාභ ලැබීමටත් ඉඩප්‍රස්ථා සලසා දීම** සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතුය. එබැවින් මහ බැංකුව මෙම ප්‍රයත්න සාර්ථක කර ගැනීම උදෙසා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වූ සිය කාර්යභාරය තවදුරටත් ඉටුකරනු ඇත. ආර්ථික වර්ධන ක්‍රියාවලියට සැමට සහභාගී වීමට ඉඩ ලබාදීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගයක් ලෙස **මූල්‍ය සාක්ෂරතාවය** වර්ධනය කිරීමෙහිලා විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

**ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිව්‍යුහගත කරනු ලබන බව** රජය විසින් ප්‍රකාශයට පත්කර ඇති බව ද මා මෙහිදී සඳහන් කළ යුතුව ඇත. විශේෂයෙන්ම මූල්‍ය පද්ධතියේ අංශ නියාමනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ශක්තිමත් බලතල ලබාදීමට මුදල් නීති පනත හා බැංකු පනත **යාවත්කාලීන කිරීම** හා නීතිමය සංශෝධන හඳුන්වා දෙන ඵලදායී ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලියක් සතුටින් පිළිගැනීමට අපි කැමැත්තෙමු. **තවද, එය මහ බැංකුවේ විශ්වසනීයත්වය ඉහළ නැංවීම කෙරෙහි උපකාරී වනු ඇති අතර, ස්වාධීනත්වය ආරක්ෂා කරමින් එහි කාර්යයන්**

**වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට අවකාශ සලසනු ඇතැයි** අපි විශ්වාස කරමු**.**

මෙම ප්‍රකාශය අවසාන කිරීමට පෙර ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව අත්පත් කර ගැනීමෙහිලා මෙන්ම නියෝජිත හා උපයෝගී සේවා ක්‍රියාත්මක කිරීමේ දී අප වෙත සහාය දුන් බොහෝ පුද්ගලයින් වෙත මාගේ කෘතඥතාව පළ කරන්නට කැමැත්තෙමි. මෙම කාර්යයේ දී අප වෙත ලබා දුන් නායකත්වය සහ උපදෙස් වෙනුවෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ට හා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ට ද, වඩා යහපත් ආර්ථික කළමනාකරණයක් සඳහා මුදල් අමාත්‍යාංශය හා මහ බැංකුව අතර මනා සම්බන්ධීකරණයක් අත්‍යවශ්‍ය බැවින් ඒ සඳහා ලබා දුන් සහයෝගය වෙනුවෙන් ගරු මුදල් අමාත්‍ය රවී කරුණානායක මැතිතුමන්ට ද මාගේ කෘතඥතාව පළ කරනු කැමැත්තෙමි.

මුදල් මණ්ඩලයේ සාමාජිකයින්ගේ නොමසුරු සහයෝගය සහ විචක්ෂණශීලී උපදෙස් ලබා ගැනීමට මම භාග්‍යවන්ත වී ඇත්තෙමි. මුදල් මණ්ඩල සාමාජිකයන් වන මහා භාණ්ඩාගාරයේ ලේකම්, ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා, මනෝහරී රාමනාදන් මහත්මිය, ක්‍රිශාන්ත පෙරේරා මහතා සහ නිහාල් ෆොන්සේකා මහතා වෙත මාගේ කෘතඥතාව පළ කරමි. අද දවසේ අප මුහුණපා ඇති අභියෝගාත්මක ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා ඔවුහු තම කාලය විශාල ලෙස කැප කරති. නියෝජ්‍ය අධිපතිවරුන් වන ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා, පී. සමරසිරි මහතා සහ එස්. ලංකාතිලක මහතා ලබාදුන් අඛණ්ඩ සහාය සහ විශිෂ්ට හා ඉහළ වෘත්තීමය උපදෙස් වෙනුවෙන් මම ඔවුන්ට ද ස්තුති කරමි. අවසාන වශයෙන් සහකාර අධිපතිවරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට, විශේෂයෙන්ම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීමට ගන්නා ලද උත්සාහය වෙනුවෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාට සහ එම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට මෙන්ම, ප්‍රවීණ හා වෘත්තීමය හැකියාව මත පිහිටා කාර්යක්ෂම ලෙස, මහ බැංකුවේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා දායකත්වය ලබාදුන් මහ බැංකුවේ සියලුම කාර්ය මණ්ඩලයට මම ප්‍රශංසා කරමින් සුභ පතමි. කුමන හෝ ආයතනයක සහ එහි කාර්ය මණ්ඩලයේ වැදගත් මාර්ගෝපදේශ මූලධර්ම වනුයේ වෘත්තීමයභාවය, තාක්ෂණික නිපුණත්වය සහ අවංකභාවය බව මහ බැංකුවේ මාගේ පළමු රාජකාරී දිනයේ දී ප්‍රකාශ කළෙමි. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය තුළ මෙම ගති ලක්ෂණවලින් හෙබි නිලධාරීන් රාශියක් සිටින බව මා පවසනුයේ ඉමහත් සතුටෙනි.

ස්තුතියි. 2017 වසර ඔබ සැමට සෞභාග්‍යමත් සුබ නව වසරක් වේවායි මම ප්‍රාර්ථනා කරමි.